# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2320/35 - 2023 පෙබරවාරි මස 21 වැනි අඟහරුවාදා - 2023.02.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.-බී. 3/2013 (iii)

### 1971 අංක 52 දරන වෙළඳ නැව් පනත

1971 අංක 52 දරන වෙළඳ නැව් පනතේ 139 වන වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 321 වන වගන්තිය යටතේ වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

**නිමල් සිරිපාල ද සිල්වා,**
වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍ය.

2023 පෙබරවාරි මස 08 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. (1) මේ නියෝග, 2023 අංක 01 දරන වෙළඳ නැව් (සමුද්‍රීය ආරක්ෂාව වැඩි කිරීම සඳහා වූ විශේෂ පියවර) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

   (2) (මෙහි මින්මතු "සම්මුතිය" යනුවෙන් හඳුන්වනු ලබන) 1974 මුහුදේ දී ජීවිත ආරක්ෂාව සඳහා වූ ජාත්‍යන්තර සම්මුතියේ XI-2 වන පරිච්ඡේදය, කලින් කලට සංශෝධිත පරිදි වන 1988 ප්‍රෝටකෝලය සහ ජාත්‍යන්තර නෞකා සහ වරාය පහසුකම් ආරක්ෂක (ISPS) සංග්‍රහයට පසුව සිදු කරනු ලබන සංශෝධන බලාත්මක කිරීම මේ නියෝග යන්හි කාර්යය විය යුතු ය.


1A - G 38919 — 07 (2023/02)


*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## I වන කොටස

*මේ නියෝගවල අදාළත්වය*

2. (1) මේ නියෝගයේ (2) වන අනු නියෝගයේ විධිවිධානවලට යටත්ව මෙම නියෝග -

(අ) ශ්‍රී ලංකා ධජය සහිතව යාත්‍රා කිරීමට හිමිකම් ලබන්නා වූ සහ ජාත්‍යන්තර යාත්‍රා කිරීම්වල නිරත වන පහත දැක්වෙන නැව් වර්ග වලට එනම්;

(i) අධිවේගී මගී යාත්‍රා ඇතුළු මගී නෞකාවලට;

(ii) දළ වශයෙන් ටොන් 500 සහ ඊට වැඩි අධිවේගී යාත්‍රා ඇතුළු භාණ්ඩ නෞකා වලට; සහ

(iii) දියඹේ පිහිටි ජංගම කැනීම් ඒකකවලට;

(ආ) සම්මුතිය අදාළ වන විදේශීය නෞකා ශ්‍රී ලංකා ජලතීරයේ තිබෙන අතරතුර දී එවැනි නෞකාවලට; සහ

(ඇ) (අ) සහ (ආ) ඡේදවල නිශ්චිතව සඳහන් කරන ලද නෞකාවලට,

වරාය පහසුකම් සැපයීමේ දී, අදාළ විය යුතු ය.

(2) මේ නියෝග -

(අ) යුධ නෞකා සහ සෙබළ නෞකා සඳහා;

(ආ) දළ බර ටොන් 500 ට වඩා අඩු භාණ්ඩ නෞකා සඳහා;

(ඇ) යාන්ත්‍රික ක්‍රම මගින් ප්‍රචාලනය නොකරන නෞකා සඳහා;

(ඈ) ප්‍රාථමික ලෙස සකස් කළ ලී නෞකා සඳහා;

(ඉ) වෙළෙඳාමේ නොයෙදෙන විනෝද යාත්‍රා සඳහා;

(ඊ) ධීවර යාත්‍රා සඳහා; සහ

(උ) වාණිජමය නොවන කාර්යයන් සඳහා භාවිතා කරන රජය විසින් මෙහෙයවන නෞකාවලට,

අදාළ නොවිය යුතු ය.

3. (1) සාමාන්‍යයෙන් ජාත්‍යන්තර යාත්‍රා කිරීම්වල නිරත නොවන එහෙත් සුවිශේෂ තත්ත්වයන්වල දී තනි ජාත්‍යන්තර යාත්‍රා කිරීමක් භාර ගැනීමට අපේක්ෂා කරන නෞකාවක්, මේ නියෝගවල "අධ්‍යක්ෂ-ජනරාල්වරයා" ලෙස සඳහන් කරනු ලබන) වෙළඳ නැව් අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින්, අධ්‍යක්ෂ-ජනරාල්වරයාගේ මතය අනුව, නෞකාව විසින් භාරගැනීමට නියමිත ගමන සඳහා, ප්‍රමාණවත් ආරක්ෂක නියමයන් හා අනුකූල වේ නම්, මේ නියෝගවලින් සපයා ඇති යම් අවශ්‍යතාවයකින් නිදහස් කරනු ලැබිය හැකි ය.

(2) මේ නියෝගය යටතේ ප්‍රදානය කරනු ලබන නිදහස් කිරීමක්-

(අ) එය ලිඛිතව ඇත්නම්;

(ආ) එය බලාත්මක වන දිනය එහි නිශ්චිතව දක්වා ඇත්නම්; සහ

(ඇ) නිදහස් කිරීමක් සම්බන්ධ කාරණාවක දී, එය ලබා දී ඇති නියමයන් (ඇත්නම්) නිශ්චිතව දක්වා ඇත්නම්,

පමණක් වලංගු විය යුතු ය.

(3) මේ නියෝග යටතේ ප්‍රදානය කරනු ලැබූ යම් නිදහස් කිරීමක්, සාධාරණ දැනුම්දීමක් මත, අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් වෙනස් කිරීම හෝ අවලංගු කිරීම කළ හැකි ය.

## II වන කොටස

*නැව්වල ආරක්ෂාව*

4. (1) මෙම නියෝගවල II වන කොටසේ කාර්යය සඳහා සහ සම්මුතියේ XI-2 පරිච්ඡේදයේ සහ ISPS සංග්‍රහයේ විධිවිධානවලට අනුකූලව, මේ නියෝග අදාළ වන ශ්‍රී ලංකාවේ නෞකාවල සහ විදේශීය නෞකාවල නාවික ආරක්ෂාව බලාත්මක කිරීමට අධ්‍යක්ෂ-ජනරාල්වරයාට පැවරිය යුතු ය.

(2) සම්මුතියේ XI-2 පරිච්ඡේදයේ සහ ISPS සංග්‍රහයේ අ කොටසේ විධිවිධාන යටතේ-

(අ) නෞකා සඳහා අදාළ කරගත හැකි ආරක්ෂක මට්ටම සකස් කිරීම සඳහා;

(ආ) නෞකා ආරක්ෂක සැලසුම් සහ කලින් අනුමත කළ සැලසුම්වලට අදාළ සංශෝධන අනුමත කිරීම සඳහා;

(ඇ) සම්මුතියේ XI-2 පරිච්ඡේදයේ සහ ISPS සංග්‍රහයේ අ කොටසේ විධිවිධානවලට අනුකූලව නෞකාවල අනුකූලතාවය තහවුරු කිරීම සහ ජාත්‍යන්තර නෞකා ආරක්ෂණ සහතිකය නෞකාවලට නිකුත් කිරීම සඳහා;

(ඈ) සම්මුතියේ XI-2 පරිච්ඡේදයේ 9 වන නියෝගයට අනුකූලව පාලනය සහ අනුකූලතා පියවර ක්‍රියාත්මක කිරීම සඳහා;

(ඉ) අනුමත නෞකා ආරක්ෂක සැලසුම් පරීක්ෂා කිරීම සඳහා; සහ

(ඊ) සම්මුතියේ XI-2 පරිච්ඡේදයේ 13 වන නියෝගයට අනුකූලව සංවිධානවලට සහ නාවික සහ වරාය කර්මාන්තවලට තොරතුරු සන්නිවේදනය කිරීම සඳහා,

අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් වගකිව යුතු ය.

(3) අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් ISPS සංග්‍රහයේ අ කොටසේ නිශ්චිතව නියමකර ඇති පරිදි ආරක්ෂක මට්ටම් සකස් කළ යුතු අතර ශ්‍රී ලංකා ධජය සහිතව යාත්‍රා කිරීමට හිමිකම් ලබන නෞකාවලට ආරක්ෂක මට්ටම පිළිබඳ තොරතුරු සැපයීම සහතික කළ යුතු ය. එසේ වුව ද, ආරක්ෂක මට්ටම වෙනස් වුවහොත් අවස්ථානුකූලව ආරක්ෂක මට්ටම පිළිබඳ තොරතුරු යාවත්කාලීන කළ යුතු ය.

(4) (3) වන අනු නියෝගයට අනුව, සුදුසු ආරක්ෂක මට්ටම් සකස් කිරීමේ දී පහත දැක්වෙන කරුණු ද ඇතුළත්ව සලකා බැලිය යුතු ය.

(අ) තර්ජන පිළිබඳ තොරතුරු විශ්වාස කළ හැකි මට්ටම;
(ආ) තර්ජන පිළිබඳ තොරතුරු තහවුරු වන මට්ටම;
(ඇ) තර්ජන පිළිබඳ තොරතුරු නිශ්චිත මට්ටමේ ඒවා ද නැතහොත් ආසන්න මට්ටමේ ඒවා ද; සහ
(ඈ) එවැනි ආරක්ෂක සිද්ධියක දී ඇතිවිය හැකි ප්‍රතිඵල.

5. (1) ශ්‍රී ලංකා නෞකා සමාගමක්, ISPS සංග්‍රහයේ ආ කොටසේ දෙන ලද මාර්ගෝපදේශ සැලකිල්ලට ගනිමින්, සම්මුතියේ XI-2 පරිච්ඡේදයේ සහ ISPS සංග්‍රහයේ අ කොටසේ අදාළ නියමයන්ට අනුකූල විය යුතු ය.

(2) නෞකාවක්, ISPS සංග්‍රහයේ ආ කොටසේ දී ඇති මාර්ගෝපදේශ සැලකිල්ලට ගනිමින්, සම්මුතියේ XI-2 පරිච්ඡේදයේ සහ ISPS සංග්‍රහයේ අ කොටසේ අදාළ නියමයන්ට අනුකූල විය යුතු අතර ISPS සංග්‍රහයේ අ කොටසේ සපයා ඇති පරිදි එම අනුකූලතාව තහවුරු කර සහතික කළ යුතු ය.

(3) නෞකාවක්, ශ්‍රී ලංකාව තුළ වරායකට ඇතුළුවීමට පෙරාතුව හෝ වරාය තුළ සිටින අතරතුර දී, ශ්‍රී ලංකා රජය විසින් සකස් කරන ලද ආරක්ෂක මට්ටම, යාත්‍රා කරන නෞකාවේ ධජය හිමි රජය විසින් සකස් කළ ආරක්ෂක මට්ටමට වඩා ඉහළ මට්ටමක පවතී නම්, ශ්‍රී ලංකා රජය විසින් සකස් කළ ආරක්ෂක මට්ටම සඳහා වන නියමයන්ට අනුකූල විය යුතු ය.

(4) ශ්‍රී ලංකාවේ නෞකාවක්, ගිවිසුම්කාර රජයක වරායකට ඇතුළුවීමට පෙරාතුව හෝ ගිවිසුම්කාර රජයක වරායක සිටින අතරතුර දී, ඒ ගිවිසුම්කාර රජය විසින් සකස් කළ ආරක්ෂක මට්ටම, අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් සකස්කළ ආරක්ෂක මට්ටමට වඩා ඉහළ මට්ටමක පවතීනම්, ඒ ගිවිසුම්කාර රජය විසින් සකස් කළ ආරක්ෂක මට්ටම සඳහා වූ නියමයන්ට අනුකූල විය යුතු ය.

(5) නෞකාධිපතිවරයා අනවශ්‍ය ප්‍රමාදයකින් තොරව ඉහළ ආරක්ෂක මට්ටමකට යම් වෙනසක් සිදු කිරීමට ප්‍රතිචාර දැක්විය යුතු ය.

(6) නෞකාවක්, සම්මුතියේ XI-2 පරිච්ඡේදයේ නියමයන්ට හෝ ISPS සංග්‍රහයේ අ කොටසේ නියමයන්ට අනුකූලතාවයක් නොමැති අවස්ථාවක දී හෝ ශ්‍රී ලංකා රජය විසින් හෝ වෙනත් ගිවිසුම්කාර රජයක් විසින් හෝ සකස් කරන ලද ආරක්ෂක මට්ටමේ නියමයන්ට අනුකූලවීමට හෝ ඒ නැවට අදාළ කර ගැනීමට නොහැකි අවස්ථාවක දී, නෞකාධිපතිවරයා විසින්, යම් නෞකාවක් හා වරායක් අතර අන්තර් සම්බන්ධයක් සිදු වීමට පෙරාතුව හෝ වරායට ඇතුළුවීමට පෙරාතුව යන අවස්ථාවලින් ප්‍රථමයෙන්ම එළඹෙන අවස්ථාවේ දී අධ්‍යක්ෂ-ජනරාල්වරයාට හෝ ඒ රජයෙන් පත්කළ බලධරයාට දැනුම් දිය යුතු ය:

6. නෞකා සමාගමක් විසින්,

(1) කාර්ය මණ්ඩලයේ සාමාජිකයන් පත් කිරීම සඳහා වගකිව යුතු තැනැත්තා හෝ ඒ නෞකාවේ කටයුතු සඳහා නැව තුළ සේවයේ යෙදී සිටින හෝ නිරත වී සිටින වෙනත් තැනැත්තන්;

(2) නෞකාවේ රැකියාව තීරණය කිරීම සඳහා වගකිව යුතු තැනැත්තන්; සහ

(3) නෞකාව, අධිකාර පත්‍රයක කොන්දේසි යටතේ සේවයේ යෙදෙන අවස්ථාවක දී නම් ඒ අධිකාර පත්‍රයට අයත් පාර්ශවයන්,

පිළිබඳව ශ්‍රී ලංකා රජය විසින් නිසිලෙස බලය පවරන ලද නිලධාරීන් මගින් තහවුරු කර ගත හැකි තොරතුරු ඕනෑම අවස්ථාවක දී නැව තුළ දී ඒ නැවේ නෞකාධිපතිවරයාට ලබා ගත හැකි බවට සහතික විය යුතු ය.

7. (1) අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින්,

(අ) අධ්‍යක්ෂ-ජනරාල්වරයා වෙනුවෙන් නැව් ආරක්ෂක සැලසුම්වල හෝ ඒවාට කරන සංශෝධන සඳහා අනුමතිය දීම; සහ

(ආ) අධ්‍යක්ෂ-ජනරාල්වරයා වෙනුවෙන් සම්මුතියේ XI-2 පරිච්ඡේදයේ සහ ISPS සංග්‍රහයේ අ කොටසේ නියමයන්ට ශ්‍රී ලංකා නැව්වල අනුකූලතාවය අනුමත කර සහතික කිරීම,

ඇතුළුව, සම්මුතියේ XI-2 පරිච්ඡේදයේ සහ ISPS සංග්‍රහයේ අ කොටසේ නියම කර ඇති පරිදි ඇතැම් ආරක්ෂාවට අදාළ කටයුතු භාරගැනීමට පිළිගත් ආරක්ෂක සංවිධානවලට බලය පැවරිය හැකි ය.

(2) පිළිගත් ආරක්ෂක සංවිධානවලට බලය පැවරීමේ දී අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් එවැනි සංවිධානයක නිපුණතාවය සලකා බැලිය යුතු ය. පිළිගත් ආරක්ෂක සංවිධානයකට-

(අ) ආරක්ෂක අංශවල ප්‍රවීනතාවය;

(ආ) නෞකා සහ වරාය සැලසුම්, නිර්මාණ සහ ඉදිකිරීම් සම්බන්ධයෙන් සහ වරාය පහසුකම් සම්බන්ධයෙන් සේවා සපයන්නේ නම්, නෞකා සැලසුම්, නිර්මාණ සහ තැනීම පිළිබඳ දැනුම ඇතුළුව නෞකා සහ වරාය මෙහෙයුම් පිළිබඳ නිසි දැනුම;

(ඇ) නෞකාවක හෝ වරායක අන්තර් සම්බන්ධතාවය ඇතුළුව නෞකා සහ වරාය පහසුකම් මෙහෙයුම් තුළ දී ඇති විය හැකි බවට සිතිය හැකි ආරක්ෂක අවදානම් තක්සේරු කිරීමේ හැකියාව සහ ඒ අවදානම් තත්ත්වයන් අවම කරන්නේ කෙසේ ද යන්න පිළිබඳව;

(ඈ) ඔවුන්ගේ සේවක පිරිසේ නිපුනතාවය පවත්වාගෙන යාමේ සහ වැඩි දියුණු කිරීමේ හැකියාව;

(ඉ) ඔවුන්ගේ සේවක පිරිසේ අඛණ්ඩ විශ්වාසදායක බව අධීක්ෂණය කිරීමේ හැකියාව;

(ඊ) ආරක්ෂක සංවේදී ද්‍රව්‍ය පිළිබඳව අනවසර හෙළිදරව් කිරීම හෝ ඒවාට ප්‍රවේශ වීම වැළැක්වීමට සුදුසු පියවර පවත්වාගෙන යාමේ හැකියාව;

(උ) සම්මුතියේ XI-2 පරිච්ඡේදයේ සහ ISPS සංග්‍රහයේ අ කොටසේ නියමයන් සහ අදාළ ජාතික සහ ජාත්‍යන්තර නීති සම්පාදනය පිළිබඳ සහ ආරක්ෂක නියමයන් පිළිබඳ දැනුම;

(ඌ) පවතින ආරක්ෂක තර්ජන සහ ක්‍රම පිළිබඳ දැනුම;

(එ) ආයුධ, අන්තරායකර ද්‍රව්‍ය සහ උපකරණ හඳුනාගැනීමේ සහ අනාවරණය කරගැනීමේ දැනුම;

(ඒ) ආරක්ෂාවට තර්ජනයක් විය හැකි තැනැත්තන්ගේ චරිත ලක්ෂණ සහ හැසිරීම් රටා අනුව, වෙනස් කොට සැලකීමක් නොවන පදනමක් මත, හඳුනාගැනීමේ දැනුම;

(ඔ) ආරක්ෂක පියවර මඟ හැරයාමට භාවිතා කරන තාක්ෂණික ක්‍රම පිළිබඳ දැනුම; සහ

(ඕ) ආරක්ෂක සහ සෝදිසි කිරීමේ උපකරණ සහ පද්ධති මෙන්ම ඒවායේ මෙහෙයුම් සීමාවන් පිළිබඳ දැනුම,

විස්තර කොට දැක්වීමට හැකි විය යුතු ය.

(3) පිළිගත් ආරක්ෂක සංවිධානයකට නිශ්චිත කාර්යයක් පවරන විට අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, ඒ පිළිගත් ආරක්ෂක සංවිධානයට එම කර්තව්‍ය භාරගැනීමට අවශ්‍ය කරන ප්‍රවීණතාවය තිබෙන බවට සහතික විය යුතු ය.

(4) නෞකා ආරක්ෂක තක්සේරු කිරීම සහ නෞකා ආරක්ෂක හෝ සැලසුම් හා කර්තව්‍ය නෞකා ආරක්ෂක තක්සේරුව හෝ සැලැස්ම සම්පූර්ණ කිරීම ඇතුළත් ආරක්ෂක කරුණු පිළිබඳව පිළිගත් ආරක්ෂක සංවිධානයක් විසින් සමාගම්වලට උපදෙස් හෝ සහාය සැපයීම කළ හැකි ය.

(5) 2022 ජනවාරි මස 6 වන දින අංක 2261/49 දරන *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබූ 2022 අංක 1 දරන වෙළඳ නැව් (සමීක්ෂණ සහ සහතික) නියෝගවල සඳහන් කරන ලද පිළිගත් සංවිධාන, (2) වන සහ (3) වන අනු නියෝගවල නියමයන් ඒ සංවිධානය විසින් සපුරා ඇත්නම්, මේ නියෝගයේ (1) වන අනු නියෝගයේ සඳහන් පිළිගත් ආරක්ෂක සංවිධාන ලෙස පත් කරනු ලැබිය හැකි ය.

8. ශ්‍රී ලංකා ධජය යටතේ යාත්‍රා කිරීමට හිමිකම් ලබන නෞකාවල, නෞකා ආරක්ෂක තක්සේරු සහ නෞකා ආරක්ෂක සැලසුම්වලට අදාළ ආරක්ෂක සංවේදී ද්‍රව්‍ය පිළිබඳ අනවසර හෙළිදරව් කිරීම් හෝ ඒවාට ප්‍රවේශ වීම මග හැරීමට සුදුසු පියවර ගෙන ඇති බවට අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් සහතික විය යුතු ය.

9. (1) නෞකා හා වරාය අතර අන්තර් සම්බන්ධතාවල දී හෝ නෞකාවකින් නෞකාවකට සිදුවන කටයුතුවල දී තැනැත්තන්ට, දේපළවලට හෝ පරිසරයට ඇතිවන අවදානම තක්සේරු කරමින් කුමන අවස්ථාවක දී ආරක්ෂක ප්‍රකාශයක් අවශ්‍ය වන්නේ ද යන්න අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් තීරණය කළ යුතු ය.

(2) මේ නියෝගයේ (1) වන අනු නියෝගයේ සඳහන් කරන ලද ආරක්ෂක ප්‍රකාශයේ, වරාය පහසුකමක් සහ නෞකාවක් (හෝ නෞකා අතර) අතර හුවමාරු කරගත හැකි ආරක්ෂක අවශ්‍යතාවයන් ගෙන හැර දැක්විය යුතු අතර ඒ එකිනෙක සඳහා වන වගකීම ප්‍රකාශ කළ යුතු ය.

(3) නෞකාවක් විසින්-

(අ) එම නෞකාව, වරාය පහසුකම් හෝ එයට අන්තර් සම්බන්ධ වන වෙනත් නෞකාවකට වඩා උපරිම ආරක්ෂක තත්ත්වයකින් මෙහෙය වන විට;

(ආ) ඇතැම් ජාත්‍යන්තර යාත්‍රා කිරීම් හෝ එවැනි යාත්‍රා කිරීම් සඳහා වන විශේෂිත නෞකා ආවරණය කරමින් රජයන් අතර ආරක්ෂක ප්‍රකාශයක් මත ගිවිසුමක් පවතින විට;

(ඇ) අදාළ වන පරිදි, නෞකාව සම්බන්ධව හෝ වරාය පහසුකම් සම්බන්ධව ආරක්ෂක තර්ජනයක් හෝ ආරක්ෂක සිද්ධියක් තිබී ඇති විට;

(ඈ) අනුමත වරාය පහසුකම් ආරක්ෂක සැලසුමක් තිබීමට සහ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය නොවන වරායක නෞකාව තිබෙන විට; හෝ

(ඉ) අනුමත නෞකා ආරක්ෂක සැලසුමක් තිබීමට සහ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය නොවන වෙනත් නෞකාවක් සමඟ නෞකාවෙන් නෞකාවට කටයුතු මෙහෙයවන නෞකාවක් වන විට,

ආරක්ෂක ප්‍රකාශයක් සම්පූර්ණ කිරීම ඉල්ලා සිටිය හැකි ය.

(4) ආරක්ෂක ප්‍රකාශයක්-

(අ) සුදුසු නම්, නෞකාව වෙනුවෙන් නෞකාධිපතිවරයා හෝ නෞකා ආරක්ෂක නිලධරයකු විසින්; සහ

(ආ) වරාය පහසුකම් වෙනුවෙන්, වරාය පහසුකම් ආරක්ෂක නිලධරයකු හෝ වෙරළ ප්‍රදේශයේ ආරක්ෂාව සඳහා වගකිව යුතු වෙනත් යම් ආයතනයේ පුද්ගලයකු විසින්,

සම්පූර්ණ කළ යුතු ය.

(5) 18 වන නියෝගයේ නිශ්චිතව දක්වා ඇති පරිදි ආරක්ෂක ප්‍රකාශයක් අවම කාලයක් සඳහා නෞකාවක රඳවා තැබිය යුතු ය.

10. (1) සම්මුතියේ XI-2 වන පරිච්ඡේදයේ 6 වන නියෝගයේ නියමයන්ට අනුකූලවන නෞකා ආරක්ෂක අනතුරු අඟවීමේ පද්ධතියක් නෞකාවක සවිකරනු ලැබිය යුතු ය.

(2) නෞකා ආරක්ෂක අනතුරු ඇඟවීමේ පද්ධතිය ක්‍රියාත්මක වූ විට, මෙවැනි තත්ත්වයක් තුළ නෞකාවේ ආරක්ෂාවට තර්ජනයක් ඇති බවට හෝ එය අනතුරට පත්ව ඇති බවට දක්වමින් සමාගම, නෞකාවේ අනන්‍යතාවය, එහි පිහිටීම ඇතුළත් වන්නා වූ නෞකා ආරක්ෂක අනතුරු ඇඟවීමක් ආරම්භ කර අධ්‍යක්ෂ-ජනරාල්වරයා වෙතට සම්ප්‍රේෂණය කළ යුතු ය.

(3) (2) වන අනු නියෝගයේ සඳහන් කරන ලද නියමයන්ට අමතරව, නෞකා වෙරළ ආරක්ෂක අනතුරු ඇඟවීම් පද්ධතිය ක්‍රියාත්මක වූ විට, අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් පළ කරන ලද අදාළ ප්‍රමිතීන් ක්‍රියාත්මක කිරීමේ දී නිශ්චිතව සඳහන් කර ඇති වෙනත් පාර්ශවයන් සඳහා ද නෞකා වෙරළ ආරක්ෂක අනතුරු ඇඟවීමක් ආරම්භ කර සම්ප්‍රේෂණය කළ යුතු ය.

(4) මේ නියෝගයේ සියලු නියමයන්ට අනුකූල වන්නේ නම්, සම්මුතියේ IV වන පරිච්ඡේදයේ නියමයන් හා අනුකූල වීම සඳහා යොදන ලද රේඩියෝ සවිකිරීම් භාවිතා කිරීම මඟින් (1) වන අනු නියෝගයේ සඳහන් කරන ලද නෞකා ආරක්ෂක අනතුරු ඇඟවීම් පද්ධතියක අවශ්‍යතාව සඳහා වූ නියමයන්ට අනුකූල විය හැකි ය.

(5) ශ්‍රී ලංකාවේ නෞකාවකින් නෞකා ආරක්ෂක අනතුරු ඇඟවීමේ නිවේදනයක් අධ්‍යක්ෂ-ජනරාල්වරයාට ලැබුන විට, අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් ඒ නෞකාව ඒ අවස්ථාවේ මෙහෙයවෙමින් තිබෙන ස්ථානයට ආසන්නතම රජයට වහාම දැනුම් දිය යුතු ය.

(6) විදේශීය නෞකාවකින් නෞකා අනතුරු ඇඟවීමේ නිවේදනයක් අධ්‍යක්ෂ-ජනරාල්වරයාට ලැබුන විට, අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් ඒ යාත්‍රා කරන නැවේ ධජය දරන රජයට සහ සුදුසු නම් ඒ නෞකාව එම අවස්ථාවේ මෙහෙයවෙමින් තිබෙන ස්ථානයට ආසන්නතම රජයට වහා ම දැනුම් දිය යුතු යි.

11. (1) සමාගම විසින්, චරිතයක් විසින් හෝ වෙනත් යම් තැනැත්තකු විසින්, නෞකාවේ සුරක්ෂිතභාවය සහ ආරක්ෂාව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය වන්නා වූ නෞකාධිපතිවරයාගේ වෘත්තීමය තීන්දුවක් වන යම් තීරණයක් ගැනීමෙන් හෝ ක්‍රියාත්මක කිරීමෙන් ඒ කපිතාන්වරයා වැළැක්වීම නොකළ යුතු යි. (ගිවිසුම්කාර රජයක් විසින් නිසිලෙස බලය දෙන ලදැයි හඳුනාගත් අයවලුන් හැර) පුද්ගලයන් වෙතට හෝ ඔවුන්ගේ බලපෑම්වලට ප්‍රවේශය ප්‍රතික්ෂේප කිරීම සහ බහාලුම් හෝ වෙනත් වසන ලද භාණ්ඩ ප්‍රවාහන ඒකක ද ඇතුළත්ව නෞකාවලට භාණ්ඩ පැටවීම ප්‍රතික්ෂේප කිරීම මීට ඇතුළත් වේ.

(2) නෞකාධිපතිවරයාගේ වෘත්තීමය තීන්දුවක දී, නෞකාවේ මෙහෙයුම් අතරතුර එයට අදාළ වන යම් සුරක්ෂිතභාවය හා ආරක්ෂාව පිළිබඳ නියමයන් අතර ගැටුමක් මත වේ නම්, නෞකාධිපතිවරයා විසින් නෞකාවේ සුරක්ෂිතභාවය පවත්වාගෙන යාමට අවශ්‍ය වන්නා වූ එවැනි නියමයන්ට බලාත්මකභාවය ලබා දිය යුතු ය. එවැනි අවස්ථාවල දී, නෞකාධිපතිවරයා විසින් තාවකාලික ආරක්ෂක පියවරයන් ක්‍රියාත්මක කළ හැකි අතර නොපමාව අධ්‍යක්ෂ-ජනරාල්වරයාට සහ සුදුසු නම් නෞකාවේ මෙහෙයුම් කටයුතු සිදුවන හෝ පිවිසීමට අරමුණු කරන වරාය අයිති ගිවිසුම්කාර රජයට දැනුම් දිය යුතු ය.

(3) (3) වන අනු නියෝගය යටතේ වන එවැනි යම් තාවකාලික ආරක්ෂක පියවරයන් හැකි ඉහළම මට්ටමින් පවතින ආරක්ෂක තත්ත්වයන්ට අනුරූපී විය යුතු ය.

12. (1) අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් අනුමත කළ නෞකා ආරක්ෂක සැලසුමක් නෞකාවක් විසින් එය තුළ රැගෙන යා යුතු ය. ISPS සංග්‍රහයේ අ කොටසේ අර්ථ දක්වා ඇති පරිදි ආරක්ෂක මට්ටම් තුන සඳහා සැලසුම මඟින් විධිවිධාන සැලැස්විය යුතු ය.

(2) එවැනි සැලසුමක් ISPS සංග්‍රහයේ අ කොටසේ විධිවිධාන ගෙන හැර දැක්විය යුතු අතර ISPS සංග්‍රහයේ ආ කොටසේ දී ඇති මාර්ගෝපදේශය සැලකිල්ලට ගනිමින් ඒවා වැඩිදියුණු කළ යුතු අතර ඉංග්‍රීසි භාෂාවෙන් ලියා දැක්විය යුතු ය.

(3) මේ නියෝගවල (5) වන අනු නියෝගයේ විධිවිධානවලට යටත්ව, පිළිගත් ආරක්ෂක සංවිධානයක් විසින් නිශ්චිතව නියම කළ නෞකාවක් සඳහා නෞකා ආරක්ෂක සැලසුමක් සකස් කළ හැකි ය.

(4) අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින්, නෞකා ආරක්ෂක සැලසුම හෝ කලින් අනුමත කළ සැලසුමේ සංශෝධන විශ්ලේෂණය කර අනුමත කිරීමේ වගකීම පිළිගත් ආරක්ෂක සංවිධානවලට පවරනු ලැබිය හැකි ය.

(5) එවැනි කාරණාවල දී, පිළිගත් ආරක්ෂක සංවිධානයක් නිශ්චිත නැවක් සඳහා වූ නෞකා ආරක්ෂක සැලසුමක් හෝ එහි සංශෝධන විශ්ලේෂණය කර අනුමත කිරීම් භාරගැනීමේ දී ඒ පිළිගත් ආරක්ෂක සංවිධානය විසින් 13 වන නියෝගය යටතේ නෞකා ආරක්ෂණ තක්සේරුවක් හෝ නෞකා ආරක්ෂක සැලසුමක් හෝ එහි සංශෝධනය, විශ්ලේෂණය කිරීම හෝ යන දෙයාකාරයෙන් එක් ආකාරයකින්වත් ඊට ඇතුළත් වී සිටිනු ලැබ නොතිබිය යුතු ය.

(6) නෞකා ආරක්ෂණ සැලසුමකට හෝ කලින් අනුමත කළ සැලසුමකට සංශෝධනයන්ට අනුමතිය ලබාගැනීම සඳහා වූ ඉදිරිපත් කිරීම, එකී සැලසුම හෝ සංශෝධන වැඩි දියුණු කරනු ලැබ ඇත්තේ කුමන පදනමක් මත ද යන්න පිළිබඳ වූ ආරක්ෂක තක්සේරුවකින් සමන්විත විය යුතු ය.

(7) නෞකා ආරක්ෂණ සැලසුමේ නිශ්චිතව දක්වා ඇති ආරක්ෂක කටයුතු පිළිබඳ අභ්‍යන්තර විගණන සිදු කරන හෝ එහි ක්‍රියාත්මක කිරීම්වල ඇගයීම් කරන පිරිස්, සමාගමේ හෝ නෞකාවේ ප්‍රමාණය සහ ස්වභාවය අනුව (මෙය ක්‍රියාවේ යෙදවිය නොහැකිව ඇත්නම් මිස,) මෙය ප්‍රායෝගික නොවේ නම් මිස විගණනය කරන කටයුතුවල දී ස්වාධීනව කටයුතු කළ යුතු ය.

(8) අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් සැලසුමේ අදාළ සංශෝධන අනුමත කර ඇත්නම් මිස, අනුමත නෞකා ආරක්ෂණ සැලසුමක හෝ අනුමත සැලසුමක නිශ්චිතව සඳහන් කර ඇති යම් ආරක්ෂක උපකරණයක කුමන වෙනස්කම්, ක්‍රියාත්මක නොකළ යුතු ද යන්න අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් තීරණය කළ යුතු ය. එවැනි යම් වෙනස්කම්, අවම වශයෙන් සම්මුතියේ XI-2 පරිච්ඡේදයේ සහ ISPS සංග්‍රහයේ අ කොටසේ නියමකර ඇති එවැනි පියවර පරිදි බලාත්මක විය යුතු ය.

(9) (8) වන අනු නියෝගයට අනුව අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් විශේෂයෙන්ම අනුමත කරනු ලැබ ඇති නෞකා ආරක්ෂණ සැලසුමක හෝ ආරක්ෂක උපකරණයක වෙනස්කම්වල ස්වභාවය ඒ අනුමතිය පැහැදිලිව පෙන්නුම් කරන ආකාරයකින් ලේඛනගත කරනු ලැබිය යුතු ය. මෙම අනුමතිය නැව තුළ දී තිබිය යුතු අතර ජාත්‍යන්තර නෞකා ආරක්ෂණ සහතිකය (හෝ තාවකාලික ජාත්‍යන්තර නෞකා ආරක්ෂණ සහතිකය) සමග ඉදිරිපත් කළ යුතු ය. මෙම වෙනස්කම් තාවකාලික ඒවා වේ නම් අනුමත කළ මුල් පියවරවල් හෝ උපකරණ ප්‍රතිස්ථාපනය කළ වහාම මෙම ලියවිල්ල තවදුරටත් නෞකාව විසින් රඳවා ගැනීම අවශ්‍ය නොවේ.

(10) නෞකා ආරක්ෂණ සැලසුම ඉලෙක්ට්‍රොනික ස්වරූපයෙන් තිබිය යුතු ය. එහි අනවසර මකා දැමීම්, විනාශ කිරීම් හෝ වෙනස් කිරීම් වැළැක්වීමේ අරමුණින් කළ ක්‍රියාපටිපාටියක් මගින් එය ආරක්ෂා කළ යුතු ය.

(11) සැලසුම, අනවසර ප්‍රවේශයකින් හෝ හෙළිදරව් කිරීම්වලින් ආරක්ෂා කළ යුතු ය.

(12) සම්මුතියේ XI-2 පරිච්ඡේදයේ 9 වන නියෝගය අනුව පාලන සහ අනුකූලතා පියවර කරගෙන යාම සඳහා අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් නිසි ලෙස බලය දෙන ලද නිලධරයන් විසින් පරීක්ෂා කිරීමකට යටත් නොවන විදේශීය යාත්‍රාවල නෞකා ආරක්ෂණ සැලසුම් (13) වන අනු නියෝගයේ නිශ්චිතව දක්වා ඇති කරුණුවලින් ආරක්ෂා කෙරේ.

(13) සම්මුතියේ XI-2 පරිච්ඡේදයේ හෝ ISPS සංග්‍රහයේ අ කොටසේ නියමයන්ට අනුකූල නොවන බවට විශ්වාස කිරීමට අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් නිසි ලෙස බලය දී ඇති නිලධරයන්ට පැහැදිලි හේතු තිබේ නම් එවිට අනුකූල නොවීම තහවුරු කරගැනීමට හෝ නිවැරදි කිරීමට ඇති එකම මාර්ගය වන්නේ, නෞකා ආරක්ෂණ සැලසුමේ අදාළ නියමයන් විශ්ලේෂණය කිරීම, අනුකූල නොවීමට අදාළ සැලසුමේ විශේෂිත අංශවලට විශේෂයෙන් අවසර දී ඇති එහෙත් අදාළ නෞකාවේ, ගිවිසුම්කාර රජයේ හෝ කපිතාන්වරයාගේ එකඟත්වය ඇතිව පමණක් කරන සීමිත ප්‍රවේශයන් වේ. එසේ වුවත් ISPS සංග්‍රහයේ අ කොටසේ 9.4 වගන්තියේ .2 වන, .4 වන, .5 වන, .7 වන, .15 වන, .17 වන සහ .18 වන අනු වගන්තිවලට අදාළ වන සැලසුමේ විධිවිධාන රහසිගත තොරතුරු ලෙස සලකන අතර අදාළ ගිවිසුම්කාර රජයන් විසින් අන්‍යාකාරයකින් ගිවිසගෙන ඇත්නම් මිස පරීක්ෂා කිරීමකට යටත් කළ නොහැකි ය.

13. (1) නෞකා ආරක්ෂක ඇගයීම, ISPS සංග්‍රහයේ ආ කොටසේ දෙන ලද මාර්ගෝපදේශ සැලකිල්ලට ගනිමින්, ISPS සංග්‍රහයේ අ කොටසට අනුකූලව, නෞකාවක ආරක්ෂාව තක්සේරු කිරීමට සුදුසු නිපුණතා ඇති තැනැත්තන් විසින් කරගෙන යන බවට, සමාගමේ ආරක්ෂක නිලධරයා විසින් සහතික විය යුතු ය.

(2) 12 වන නියෝගයේ (5) වන අනු නියෝගයේ විධිවිධානවලට යටත්ව, පිළිගත් ආරක්ෂක සංවිධානයක් විසින් විශේෂිත නෞකාවක නෞකා ආරක්ෂක තක්සේරුව කරගෙන යනු ලැබිය හැකි ය.

(3) නෞකා ආරක්ෂක තක්සේරුවක, දර්ශන ආරක්ෂක සමීක්ෂණයක් සහ අවම වශයෙන් ISPS සංග්‍රහයේ අ කොටසේ නියමකරන ලද මූලිකාංගවත් ඇතුළත් කළ යුතු ය.

(4) නෞකා ආරක්ෂක තක්සේරුව, සමාගම විසින් වාර්තාගත කර, සමාලෝචනය කර, පිළිගෙන රඳවා තබාගත යුතු ය.

14. (1) මෙම නියෝග අදාළ වන නෞකාවක්, ISPS සංග්‍රහයේ අ කොටසේ නිශ්චිතව දක්වා ඇති පරිදි සත්‍යාපනය කිරීමකට යටත් විය යුතු ය.

(2) නෞකා සත්‍යාපනය කිරීම අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් කරගෙන යනු ලැබිය යුතු ය. එසේ වුව ද, අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින්, 7 වන නියෝගයේ සඳහන් කරන ලද පිළිගත් ආරක්ෂක සංවිධානයකට සත්‍යාපනය කිරීමේ වගකීම භාර දිය හැකි ය.

(3) සහතික කිරීමෙන් පසුව නෞකාවක ආරක්ෂක පද්ධතිය සහ නෞකාවේ යම් ආශ්‍රිත ආරක්ෂක උපකරණ, මේ නියෝගවල, විධිවිධානවලට ISPS සංග්‍රහයේ අ කොටසේ විධිවිධානවලට අනුමත නෞකා ආරක්ෂක සැලසුමක විධිවිධානවලට අනුකූලව පවත්වාගෙන යනු ලැබිය යුතු ය. (1) වන අනු නියෝගය යටතේ සම්පූර්ණ කරන ලද සහතික කිරීමකින් අනතුරුව අධ්‍යක්ෂ-ජනරාල්වරයාගේ අවසරය නොමැතිව ආරක්ෂක පද්ධතියේ සහ යම් ආශ්‍රිත ආරක්ෂක උපකරණයක හෝ අනුමත ආරක්ෂක නෞකා සැලසුමේ කිසිදු වෙනසක් සිදු නොකළ යුතු ය.

15. (1) ISPS සංග්‍රහයේ අ කොටසේ විධිවිධානවලට අනුකූලව මූලික හෝ අලුත් කිරීම් සත්‍යාපනය සිදු කිරීමෙන් පසුව ජාත්‍යන්තර නෞකා ආරක්ෂක සහතිකයක්, මේ නියෝග අදාළ වන්නා වූ නෞකාවකට නිකුත් කළ යුතු ය.

(2) ඒ සහතිකය නිකුත් කිරීම හෝ පිටසන් කිරීම අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් හෝ පිළිගත් ආරක්ෂක සංවිධානයක් විසින් කළ යුතු ය.

(3) (අ) (1) වන අනු නියෝගයේ සඳහන් කරන ලද ජාත්‍යන්තර නෞකා ආරක්ෂක සහතිකයක් එය නිකුත් කරන ලද දිනයේ සිට වසර පහක් නොඉක්මවන්නා වූ කාලසීමාවක් සඳහා නිකුත් කරනු ලැබිය යුතු ය.

(ආ) පවතින සහතිකයේ කල් ඉකුත්වීමේ දිනයට පෙරාතුව මාස තුනක් ඇතුළත අලුත් කිරීම සත්‍යාපනය කිරීම සම්පූර්ණ කළ විට, අලුත් සහතිකය, අලුත් කිරීම සත්‍යාපනය කිරීම සම්පූර්ණ කළ දිනයේ සිට, පවතින සහතිකයේ කල් ඉකුත් වීමේ දින සිට වසර පහක් නොඉක්මවන්නා වූ දිනය දක්වා වලංගු විය යුතු ය.

(ඇ) පවතින සහතිකයේ කල් ඉකුත්වීමේ දිනයට පසුව අලුත් කිරීම සත්‍යාපනය කිරීම සම්පූර්ණ කරන ලද විට අලුත් සහතිකය, අලුත් කිරීම සත්‍යාපනය කිරීම සම්පූර්ණ කළ දිනයේ සිට, පවතින සහතිකයේ කල් ඉකුත්වීමේ දින සිට වසර පහක් නොඉක්මවන්නා වූ දිනය දක්වා වලංගු විය යුතු ය.

(ඈ) පවතින සහතිකයේ කල් ඉකුත්වීමේ දිනයට මාස තුනකටත් පෙරාතුව අලුත් කිරීම සත්‍යාපනය කිරීම සම්පූර්ණ කර ඇති විට අලුත් සහතිකය, අලුත් කිරීම තහවුරු කිරීම සම්පූර්ණ කිරීමේ දින සිට වසර පහක් නොඉක්මවන්නා වූ දිනයක් දක්වා වලංගු විය යුතු ය.

(ඉ) වසර පහකට වඩා අඩු කාලසීමාවක් සඳහා සහතිකයක් නිකුත් කරන්නේ නම්, අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින්, 14(1) වන නියෝගයේ සඳහන් සහතිකයක් වසර පහක කාලසීමාවක් සඳහා නිකුත් කරන විට සපයා ඇති සත්‍යාපනය කිරීම් සුදුසු පරිදි අදාළ කොටගෙන (අ) ඡේදයේ නිශ්චිතව සඳහන් කර ඇති

උපරිම කාලසීමාව දක්වා කළ ඉකුත් වීමේ දිනය ඉක්මවා සහතිකයේ වලංගුභාවය අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් දීර්ඝ කරනු ලැබිය හැකි ය.

(ඊ) අලුත් කිරීම සත්‍යාපනය කිරීමක් සම්පූර්ණ කරනු ලැබ ඇත්නම් සහ පවතින සහතිකයේ කල්ඉකුත්වීමේ දිනයට පෙරාතුව අලුත් සහතිකයක් නිකුත් කිරීමට හෝ නැව මත තැබීමට නොහැකි නම් අධ්‍යක්ෂ-ජනරාල්වරයා හෝ අධ්‍යක්ෂ-ජනරාල්වරයා වෙනුවෙන් කටයුතු කරන පිළිගත් ආරක්ෂක සංවිධානයක් විසින් පවතින සහතිකය පිටසන් කළ හැකි අතර එවැනි සහතිකයක් කල් ඉකුත්වීමේ දින සිට මාස පහක් නොඉක්මවන තවදුරටත් වූ කාල සීමාවක් සඳහා වලංගු පරිදි පිළිගනු ලැබිය යුතු ය.

(උ) නෞකාවක් සහතිකය ඉකුත්වන්නා වූ කාලය වන විට එය සත්‍යාපනය කළ යුතු වරායක නොමැති විට, අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් සහතිකයේ වලංගු කාලසීමාව දීර්ඝ කරනු ලැබිය හැකි මුත් මේ දීර්ඝ කිරීම, නෞකාව සත්‍යාපනය කිරීම කළ යුතු වරාය දක්වා එහි යාත්‍රා කිරීම සම්පූර්ණ කිරීමට අවසර දීමේ කාර්ය සඳහා පමණක්, සහ එවිට එසේ කිරීම සුදුසු සහ සාධාරණ යයි පෙනී යන අවස්ථාවන් වල දී සිදු කළ යුතු ය. කිසිදු සහතිකයක් මාස තුනකට වඩා වැඩි දීර්ඝ කාල සීමාවක් සඳහා දීර්ඝ නොකළ යුතු අතර නෞකාව සත්‍යාපනය කළ යුතු වරායට එහි පැමිණීම වෙනුවෙන් දීර්ඝ කිරීමේ ප්‍රදානයක් ලබන නෞකාවක්, ඒ දීර්ඝ කිරීම ප්‍රකාරව අලුත් සහතිකයක් ලබා ගැනීමෙන් තොරව වරායෙන් පිටවීමට හිමිකම් නොලැබිය යුතු ය. අලුත් කිරීම සත්‍යාපනය කිරීම අවසන් වූ විට, අලුත් සහතිකය දීර්ඝ කිරීම ප්‍රදානයට පෙර සහතිකයේ පැවති කල්ඉකුත් වීමේ දිනයේ සිට වසර පහක් නොඉක්මවන්නා වූ දිනයකට වලංගු විය යුතු ය.

(ඌ) මේ අනු නියෝගවල ඉහත සඳහන් විධිවිධාන යටතේ, දීර්ඝ කරනු ලැබ නොමැති කෙටි යාත්‍රා කිරීම්හි යෙදෙන නෞකාවකට නිකුත් කරන ලද සහතිකයක්, අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් ඒ සහතිකයේ සඳහන් කල්ඉකුත් වීමේ දින සිට මසක සහන කාලසීමාවක් සඳහා දීර්ඝ කරනු ලැබිය හැකි ය. අලුත් කිරීම සත්‍යාපනය කිරීම සම්පූර්ණ කර ඇති විට, අලුත් සහතිකය, දීර්ඝ කිරීම ප්‍රදානයට පෙර සහතිකයේ පැවති කල්ඉකුත් වීමේ දින සිට වසර පහකට නොඉක්මවන්නා වූ දිනයක් දක්වා වලංගු විය යුතු ය.

(එ) ISPS සංග්‍රහයේ අ කොටසේ සත්‍යාපනය කිරීමේ වගන්තියේ නිශ්චිතව දක්වා ඇති කාලසීමාවට පෙරාතුව අතරමැදි සත්‍යාපනය කිරීමක් සම්පූර්ණ කර ඇත්නම්, එවිට

(i) සහතිකයේ දක්වා ඇති කල් ඉකුත්වීමේ දිනය අතරමැදි සත්‍යාපනය කිරීම සම්පූර්ණ කළා වූ දිනයට වසර තුනකට වඩා පසු නොවන දිනයකට පිටසන් කිරීම මගින් සංශෝධනය කළ යුතු ය;

(ii) අතිරේක සත්‍යාපනය කිරීම් එකක් හෝ ඊට වැඩි ගණනක් සිදු කරන්නේ නම් කල්ඉකුත් වීමේ දිනය වෙනස් නොවී පැවතිය හැකි අතර ඒ හේතුවෙන් ISPS සංග්‍රහයේ අ කොටසින් නියම කර ඇති සත්‍යාපනය කිරීම් අතර උපරිම විරාමය ඉක්මවා යාමක් සිදු නොවේ.

(4) (1) වන අනු-නියෝගය යටතේ නිකුත් කළ සහතිකයක් පහත දැක්වෙන යම් හේතුවක් නිසා වලංගුභාවය අවසන් විය යුතු ය-

(අ) ISPS සංග්‍රහයේ අ කොටසේ නිශ්චිතව දක්වා දක්වා ඇති කාල සීමාව තුළ අදාළ සත්‍යාපනය කිරීම් සම්පූර්ණ කර නොමැති නම්;

(ආ) අදාළ වේ නම්, ISPS සංග්‍රහයේ අ කොටසට අනුකූලව, සහතිකය පිටසන් කර නොමැති නම්;

(ඇ) යම් සමාගමක් මගින් කලින් මෙහෙයුම් නොකළ නෞකාවක් මෙහෙයවීම් සඳහා වගකීම එම සමාගම විසින් භාරගන්නා අවස්ථාවක; සහ

(ඈ) වෙනත් රජයක ධජය යටතට නෞකාවක් පැවරීමෙන් පසු.

(5) (අ) වෙනත් ගිවිසුම්කාර රජයක ධජය යටතට නෞකාවක් පැවරීමේ කාරණාවක දී, ඒ පැවරීමට පෙරාතුව, නෞකාව විසින් රැගෙන යන ජාත්‍යන්තර නෞකා ආරක්ෂක සහතිකයට අදාළ පිටපත් හෝ සියලු තොරතුරු සහ පවතින සත්‍යාපනය කිරීමේ වාර්තාවල පිටපත් ඒ ගිවිසුම්කාර රජයේ පරිපාලනය වෙත අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් හැකිතාක් ඉක්මනින් සම්ප්‍රේෂණය කළ යුතු ය; හෝ

(ආ) යම් සමාගමක් මගින් කලින් මෙහෙයුම් නොකළ නෞකාවක් මෙහෙයවීම සඳහා වගකීම ඒ සමාගම විසින් භාරගන්නා අවස්ථාවක දී, පෙර සමාගම විසින් හැකිතාක් ඉක්මනින් භාරගන්නා සමාගම වෙත, ජාත්‍යන්තර නෞකා ආරක්ෂණ සහතිකයට අදාළ යම් තොරතුරුවල පිටපත්, සම්ප්‍රේෂණය කිරීම හෝ 16(2) වන නියෝගයේ විස්තර කර ඇති සත්‍යාපනය කිරීම්වලට පහසුකම් සැලසීම කළ යුතු ය.

(6) ISPS සංග්‍රහයේ ඇමුණුමේ දී ඇති ආකෘතිවලට අනුරූප වන ආකාරයෙන් ජාත්‍යන්තර නෞකා ආරක්ෂණ සහතිකය, සකස් කළ යුතු අතර එය ඉංග්‍රීසි භාෂාවෙන් තිබිය යුතු ය.

16. (1) අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් හෝ පිළිගත් ආරක්ෂක සංවිධානයක් විසින්:-

(අ) නෞකාවක් සහතිකයක් නොමැතිව, බෙදා හැරීමේ හෝ නෞකාව සේවාවකට ඇතුල් වීමට හෝ නැවත ඇතුල්වීමට පෙරාතුව සිටින අවස්ථාවක දී;

(ආ) නෞකාවක්, ගිවිසුම්කාර රජයට අයත් ධජයෙන් ශ්‍රී ලංකා ධජය යටතට පැවරීමේ අවස්ථාවක දී;

(ඇ) නෞකාවක්, ගිවිසුම්කාර රජයක් නොවන රජයක් විසින් ශ්‍රී ලංකා ධජය යටතට පවරන අවස්ථාවක දී; හෝ

(ඈ) යම් සමාගමක් මගින් කලින් මෙහෙයුම් නොකළ නෞකාවක් මෙහෙයවීම සඳහා වගකීම ඒ සමාගම විසින් භාරගන්නා අවස්ථාවක දී,

15 වන නියෝගයේ සඳහන් කර ඇති ජාත්‍යන්තර නෞකා ආරක්ෂක සහතිකයක් නිකුත් කරන තෙක් තාවකාලික ජාත්‍යන්තර නෞකා ආරක්ෂක සහතිකයක් නිකුත් කරනු ලැබිය හැකි ය.

(2) මේ නියෝගවල (1) වන අනු-නියෝගයේ සඳහන් තාවකාලික ජාත්‍යන්තර නෞකා ආරක්ෂක සහතිකයක්-

(අ) ISPS සංග්‍රහයේ අ කොටසින් නියම කර ඇති නෞකා ආරක්ෂක තක්සේරුව සම්පූර්ණ කර ඇති බවට;

(ආ) නෞකාව තුළ දී සපයන ISPS සංග්‍රහයේ අ කොටසේ සහ සම්මුතියේ XI-2 පරිච්ඡේදයේ විධිවිධානවල නියමයන් සපුරාලන නෞකා ආරක්ෂක සැලසුමක පිටපතක් විශ්ලේෂණය සහ අනුමතිය සඳහා භාර දී ඇති බවට සහ නෞකාව තුළ ක්‍රියාත්මක වෙමින් පවතින බවට;

(ඇ) අවශ්‍ය නම්, සම්මුතියේ XI-2 වන පරිච්ඡේදයේ 6 වන නියෝගයේ විධිවිධානවල නියමයන් සපුරාලන නෞකා ආරක්ෂක අනතුරු ඇඟවීම් පද්ධතියක් නෞකාවට සපයා ඇති බවට;

(ඇ) සමාගමේ ආරක්ෂක නිලධරයා විසින්-

(i) (අ) ISPS සංග්‍රහයේ අ කොටස සමඟ අනුකූල වීම සඳහා නෞකා ආරක්ෂක සැලසුම විශ්ලේෂණය කර ඇති බව සහතික කර ඇති බවට;

(ආ) සැලසුම අනුමතිය සඳහා ඉදිරිපත් කර ඇති බව සහතික කර ඇති බවට; සහ

(ඇ) නෞකාව තුළ සැලසුම ක්‍රියාත්මක වෙන බවට සහතික කර ඇති බවට; සහ

(ii) ISPS සංග්‍රහයේ අ කොටසට අනුකූලව මාස හයක් තුළ නෞකාව විසින් නියම කළ සත්‍යාපනය කිරීම සාර්ථකව සම්පූර්ණ කරන බවට සමාගමේ ආරක්ෂක නිලධරයා සෑහීමට පත්වීම තුළින් පුහුණුවීම්, ක්‍රියාකාරකම් සහ අභ්‍යන්තර විගණන සඳහා වූ සැලසුම් ඇතුළුව අවශ්‍ය සැලසුම් ස්ථාපිත කර ඇති බවට;

(ඉ) නියම කළ සත්‍යාපනය කිරීම් සිදු කිරීම සඳහා සැලසුම් සකස් කරනු ලැබ ඇති බවට;

(ඊ) නෞකාධිපතිවරයා, නෞකාවේ ආරක්ෂක නිලධරයා සහ නෞකාවේ විශේෂිත ආරක්ෂක කාර්යයන් සමග වූ අනෙක් පිරිස ISPS සංග්‍රහයේ අ කොටසේ නිශ්චිතව දක්වා ඇති පරිදි ඔවුන්ගේ කාර්යයන් හා වගකීම් පිළිබඳ හොඳින් දන්නා බවට; සහ නෞකාවේ පවතින නෞකා ආරක්ෂක සැලසුමේ අදාළ විධිවිධාන පිළිබඳ හොඳින් දන්නා බවට සහ; නෞකාවේ කාර්ය මණ්ඩලය වැඩකරන භාෂාවෙන් හෝ ඔවුන්ට තේරෙන භාෂාවලින් ඒ තොරතුරු සපයා ඇති බවට; සහ

(උ) නෞකා ආරක්ෂක නිලධරයා විසින් මේ නියෝගවල විධිවිධානවල නියමයන් සපුරා ඇති බවට,

අධ්‍යක්ෂ-ජනරාල්වරයා හෝ පිළිගත් ආරක්ෂක සංවිධානයක් විසින් තහවුරු කර ඇති අවස්ථාවක දී පමණක් නිකුත් කරනු ලැබිය යුතු ය.

(3) තාවකාලික ජාත්‍යන්තර නෞකා ආරක්ෂක සහතිකයක් එය නිකුත් කරන ලද දින සිට මාස හයක කාලයක් සඳහා හෝ 15 වන නියෝගයේ නියම කර ඇති ජාත්‍යන්තර නෞකා ආරක්ෂක සහතිකයක් නිකුත් කරන තෙක් යන පළමුවෙන් එළඹෙන කවර හෝ අවස්ථාවක් සඳහා වලංගු විය යුතු අතර එය දීර්ඝ කරනු නොලැබිය යුතු ය.

(4) ISPS සංග්‍රහයේ ඇමුණුමේ දී ඇති ආකෘතියට අනුරූපවන ආකාරයෙන් තාවකාලික නෞකා ආරක්ෂක සහතිකයක් සකස් කළ යුතු අතර එය ඉංග්‍රීසි භාෂාවෙන් තිබිය යුතු ය.

17. (1) සම්මුතිය අදාළ වන රටක රජයේ ඉල්ලීමක් පරිදි අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින්, නෞකාවක් සත්‍යාපනය කිරීමට සලස්වනු ලැබිය හැකි අතර ISPS සංග්‍රහයේ විධිවිධාන හා අනුකූල බවට සෑහීමට පත්වේ නම් නෞකාවට, ජාත්‍යන්තර නෞකා ආරක්ෂක සහතිකයක් හෝ තාවකාලික ජාත්‍යන්තර නෞකා ආරක්ෂක සහතිකයක් නිකුත් කිරීම හෝ නිකුත් කිරීමට බලය දීම සහ සුදුසු අවස්ථාවල දී ISPS සංග්‍රහයට අනුව නෞකාවේ දී ඒ සහතිකය පිටසන් කිරීම හෝ පිටසන් කිරීමට බලය දීම කළ යුතු ය. එසේ නිකුත් කළ යම් සහතිකයක, නෞකාවේ ධජය හිමි හෝ යාත්‍රා කිරීමට අයිතිය ඇති රජයේ ඉල්ලීම මත එය නිකුත් කර ඇති බවට ප්‍රකාශයක් අඩංගු විය යුතු අතර එයට මෙම නියෝග යටතේ නිකුත් කළ සහතිකයක් පරිදිම බලාත්මක විය යුතු අතර එම පිළිගැනීමම ලැබිය යුතු ය. සහතිකයේ පිටපතක් සහ සත්‍යාපනය කිරීමේ වාර්තාවක පිටපතක් ඉල්ලීම කරන රජයට හැකිතාක් ඉක්මනින් ප්‍රේෂණය කළ යුතු ය.

(2) අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් සම්මුතිය අදාළ වන රටක රජයකින් ශ්‍රී ලංකාවේ නෞකාවක් සත්‍යාපනය කිරීමට සලස්වන ලෙස ඉල්ලා සිටිය හැකි අතර ISPS සංග්‍රහයේ විධිවිධාන හා අනුකූල වන බවට සෑහීමට පත් වේ නම් නෞකාවට ජාත්‍යන්තර නෞකා ආරක්ෂක සහතිකයක් හෝ තාවකාලික ජාත්‍යන්තර නෞකා ආරක්ෂක සහතිකයක් නිකුත් කිරීම හෝ නිකුත් කිරීමට බලය දිය හැකි අතර සුදුසු අවස්ථාවක දී ISPS සංග්‍රහයට අනුව නෞකාවේ දී ඒ සහතිකය පිටසන් කිරීම හෝ පිටසන් කිරීමට බලය දිය

හැකි ය. එසේ නිකුත් කළ යම් සහතිකයක, එය ශ්‍රී ලංකා රජයේ ඉල්ලීම මත නිකුත් කරනු ලැබ ඇති බවට ප්‍රකාශයක් අඩංගු විය යුතු අතර එය අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් නිකුත් කළ සහතිකයක් පරිදිම බලාත්මක විය යුතු අතර එම පිළිගැනීම ම ලැබිය යුතු ය.

18. (1) නෞකාධිපතිවරයා විසින්, නෞකා ආරක්ෂක සැලසුමේ සහ ISPS සංග්‍රහයේ අ කොටසේ නිශ්චිතව සඳහන් කර ඇති කටයුතු මාස දොළහක අවම කාල සීමාවක් සඳහා හෝ වරාය පහසුකම්වල අවසාන ඇමතුම් දහය සඳහා හෝ යන කාලසීමාවන්ගෙන් වඩා වැඩි කාල සීමාවක් සඳහා පවත්වාගෙන යා යුතු ය.

(2) වාර්තා-

(අ) ඉංග්‍රීසි භාෂාවෙන් තිබිය යුතු ය;

(ආ) ඉලෙක්ට්‍රොනික ආකෘතියකින් තිබිය යුතු ය. එවැනි අවස්ථාවක දී, ඒවායේ අනවසර මකා දැමීම්, විනාශ කිරීම් හෝ වෙනස් කිරීම් වැළැක්වීමට අරමුණු කළ ක්‍රියාමාර්ගවලින් ඒවා ආරක්ෂා කළ යුතු ය;

(ඇ) අනවසර ප්‍රවේශවලින් හෝ හෙළිදරව් කිරීම් වලින් ආරක්ෂා කළ යුතු ය.

19. (1) සමාගමක් විසින් සමාගම් ආරක්ෂක නිලධරයකු පත් කළ යුතු අතර එසේ පත් කළ තැනැත්තා විසින් සමාගම මෙහෙයවන නෞකාවල ප්‍රමාණය හෝ ස්වභාවය මත රඳා පැවතෙමින් මේ තැනැත්තා පාලනය භාරව සිටින්නේ කවර නෞකා සඳහා ද යන්න පැහැදිලිව හඳුනාගෙන නෞකා එකක් හෝ වැඩි ගණනක් සඳහා සමාගමේ ආරක්ෂක නිලධරයකු ලෙස කටයුතු කළ හැකි ය.

(2) සමාගම විසින්, ඔවුන් මෙහෙයවන නෞකාවල ප්‍රමාණය හෝ ස්වභාවය මත රඳා පැවතෙමින් මේ එක් එක් තැනැත්තා පාලනය භාරව සිටින්නේ කවර නෞකා සඳහා ද යන්න පැහැදිලිව හඳුනාගෙන සමාගම් ආරක්ෂක නිලධරයන් ලෙස තැනැත්තන් කීපදෙනෙකු පත් කළ හැකි ය.

(3) සමාගමේ ආරක්ෂක නිලධරයකුගේ කාර්යයන් සහ වගකීම ISPS සංග්‍රහයේ අ කොටසේ නිශ්චිතව දක්වා ඇති පරිදි විය යුතු ය.

20. (1) සමාගමක් එහි එක් එක් නෞකාව වෙනුවෙන් නෞකා ආරක්ෂක නිලධරයකු පත්කළ යුතු ය.

(2) නෞකා ආරක්ෂක නිලධරයකුගේ කාර්යයන් සහ වගකීම ISPS සංග්‍රහයේ අ කොටසේ නිශ්චිතව දක්වා ඇති පරිදි විය යුතු ය.

21. (1) 19 වන නියෝගයේ සඳහන් සමාගම් ආරක්ෂක නිලධරයාට සහ සුදුසු වෙරළ පදනම් කරගත් කාර්යයන්හි නියුක්ත පිරිස හට දැනුම තිබිය යුතු අතර පුහුණුව ලබා තිබිය යුතු ය ISPS සංග්‍රහයේ ආ කොටසට සහ සංවිධානය විසින් වැඩිදියුණු කරන ලද මාර්ගෝපදේශ වලට අනුව නිසිලෙස සහතික කර තිබිය යුතු ය.

(2) 20 වන නියෝගයේ සඳහන් නෞකා ආරක්ෂක නිලධරයකුට දැනුම තිබිය යුතු අතර සම්පූර්ණ පුහුණුවක් ලබා තිබිය යුතු ය, සහ 2016 ඔක්තෝබර් මස 4 වන දින අංක 1987/19 දරන *ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2016 වෙළෙඳ නැව් (මුහුදු යාත්‍රාකරුවන් පුහුණු කිරීමේ, සහතික කිරීමේ සහ මුරකාවලෙහි යෙදීමේ ප්‍රමිති) නියෝග වලට අනුකූලව ප්‍රවීණතා සහතිකයක් දැරිය යුතු ය.

(3) විශේෂිත ආරක්ෂක කාර්යයන් සහ වගකීම් දරන නෞකාව තුළ සේවයේ නියුක්ත පිරිස නෞකා ආරක්ෂක සැලසුමේ විස්තර කර ඇති පරිදි නෞකා ආරක්ෂාව සඳහා ඔවුන්ගේ වගකීම අවබෝධ කරගත යුතු අතර ඔවුන්ට ප්‍රමාණවත් දැනුමක් තිබිය යුතු ය. සම්පූර්ණ පුහුණුවක් ලබා තිබිය යුතු අතර 2016 ඔක්තෝබර් මස 4 වන දින අංක 1987/19 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද 2016 වෙළෙඳ නැව් (මුහුදු යාත්‍රාකරුවන් පුහුණු කිරීමේ, සහතික කිරීමේ සහ මුරකාවලෙහි යෙදීමේ ප්‍රමිති) නියෝග වලට අනුකූලව ප්‍රවීණතා සහතිකයක් දැරිය යුතු ය.

(4) ආරක්ෂක කාර්යයන්වලට පත් කිරීමක් නොමැතිව නෞකාව තුළ සේවයේ නියුක්ත පිරිසට සම්පූර්ණ පුහුණුවක් ලබා තිබිය යුතු අතර 2016 ඔක්තෝබර් මස 4 වන දින අංක 1987/19 දරන *ගැසට් පත්‍රයේ* පළකරන ලද වෙළෙඳ නැව් (මුහුදු යාත්‍රාකරුවන් පුහුණු කිරීමේ, සහතික කිරීමේ මුරකාවලෙහි යෙදීමේ ප්‍රමිති) නියෝග වලට අනුව ආරක්ෂක දැනුවත්භාවය සඳහා ප්‍රවීණතා සහතිකයක් දැරිය යුතු ය.

22. (1) නෞකාවේ ස්වභාවය, එහි පිරිස් වෙනස් වීම, හමුවන වරායේ ඇති පහසුකම් සහ වෙනත් අදාළ තත්ත්වයන් යන කරුණු සැලකිල්ලට ගනිමින් සුදුසු විරාමයන් අතරතුරදී නෞකාව තුළ දී පුහුණු වීම් පවත්වාගෙන යා යුතු ය.

(2) (1) වන අනු-නියෝගයේ සඳහන් කරන ලද පුහුණු කිරීම් සෑම මාස තුනකට වරක්වත් පවත්වනු ලැබිය යුතු ය. අතිරේකව, නෞකාවේ පිරිස් 25%ට වඩා වැඩියෙන් වෙනස් කර ඇති අවස්ථාවක දී, ඕනෑම අවස්ථාවක පසුගිය මාස තුන තුළ ඒ නෞකාවේ යම් පුහුණුවකට කලින් සහභාගී වී නොමැති පිරිසට, වෙනස් වීමෙන් සතියක් ඇතුළත පුහුණුවක් පවත්වනු ලැබිය යුතු ය.

(3) නෞකාවේ පුහුණු කිරීම් මගින්:-

(අ) නෞකාව තුළ අනවසර අමුත්තන් හඳුනාගැනීම සහ සෝදිසි කිරීම;

(ආ) ආරක්ෂාවට තර්ජනයක් විය හැකි ද්‍රව්‍ය හඳුනාගැනීම;

(ඇ) පහරදෙන්නන් නෞකාවට ළඟාවීමෙන් වැළැක්වීමේ ක්‍රම;

(ඈ) සීමා කරන ලද ප්‍රදේශ හඳුනාගැනීම; සහ

(ඉ) ආරක්ෂිත ස්ථානයකට රැස් කිරීම වැනි යම් අවස්ථා ආවරණය කළ යුතු ය.

(4) සමාගමේ ආරක්ෂක නිලධරයා විසින් නියමිත කාලපරාසය තුළ ක්‍රියාකාරකම්වලට සහභාගී වීමෙන් නෞකා ආරක්ෂක සැලසුමක ඵලදායී සංවිධානය සහ ක්‍රියාත්මකභාවය සහතික කළ යුතු ය.

(5) (4) වන අනු නියෝගයේ සඳහන් කරන ලද පුහුණු කිරීම්වලට සිටී නම් සමාගමේ ආරක්ෂක නිලධරයන්ගේ, වරාය පහසුකම් ආරක්ෂක නිලධරයන්ගේ, අධ්‍යක්ෂ-ජනරාල් මෙන්ම නෞකා ආරක්ෂක නිලධරයන්ගේ සහභාගීත්වය ඇතුළත් විය යුතු අතර පුහුණු කිරීම් අතර මාස දහඅටකට නොවැඩි කාලයක් සහිතව අවම වශයෙන් සෑම ලිත් වර්ෂයකට වතාවක් වත් කරගෙන යා යුතු ය.

(6) (4) වන අනු නියෝගයේ සඳහන් කරන ලද පුහුණු කිරීම්වල දී සන්නිවේදනය, සංවිධානය, සම්පත් යොදාගැනීමේ හැකියාව සහ ප්‍රතිචාර දැක්වීම පරීක්ෂා කර බැලිය යුතු ය. පුහුණුව-

(අ) පූර්ණ පරිමාණයෙන් සජීවීව;

(ආ) ප්‍රයෝග හෝ වැඩමුළුවලින්; හෝ

(ඇ) සෝදිසි කිරීම් සහ මුදවා ගැනීම් හෝ හදිසි අවස්ථා ප්‍රතිචාර ක්‍රියාකාරකම් ආදි ලෙසින් පවත්වන වෙනත් පුහුණුවලින් සංයුක්ත විය යුතු ය.

(7) ගිවිසුම්කාර රාජ්‍යයන් හා කරනු ලබන පුහුණුවීම්වල දී සමාගමේ සහභාගීත්වය අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් පිළිගත යුතු ය.

23. (1) අධි ආරක්ෂක අවදානමක් ඇති ප්‍රදේශ හරහා ගමන් කිරීමේ දී නෞකා ආරක්ෂක සැලසුමක් ඇති බවට සහ එය නෞකාධිපතිවරයා සහ නෞකා ආරක්ෂක නිලධරයා සමඟ පුහුණුවීම් කර, දැනුවත් කර සහ සාකච්ඡා කරන බවට තහවුරු කිරීමට සමාගමේ ආරක්ෂක නිලධරයා පෙළඹවීම.

(2) අධි අවදානම් ප්‍රදේශයක් හරහා සංක්‍රමණය කිරීමට පෙරාතුව ඉතා සුරක්ෂිතව සැලසුම් කර ස්ථාපනය කළ නෞකා ආරක්ෂක වැඩපිළිවෙලක් සැපයීම ඉතා දැඩි ලෙස නිර්දේශ කෙරේ.

(3) නෞකා ආරක්ෂක සැලසුමක, අන්තරායකර භාණ්ඩ හෝ අනතුරුදායක සහිත ද්‍රව්‍ය ආසන්නයේ ආයුධ භාවිතා කිරීම පිළිබඳව සුවිශේෂී මාර්ගෝපදේශ ඇතුළත් විය යුතු ය. නෞකාව තුළ රැගෙන යන ගිනි අවි ආදිය පිළිබඳව වරාය තුළට පැමිණීමේ දී දැනුම් දීමට සිදුවිය හැකි අතර වරාය තුළ සිටින කාලය තුළ දී භාරදිය හැකිව හෝ සුරක්ෂිතව දැරීමට සිදු විය හැකි ය.

24. (1) 2022 ජනවාරි මස 6 වන දිනැති අංක 2261/49 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද 2022 අංක 1 දරන වෙළෙඳ නැව් (සමීක්ෂණ සහ සහතික) නියෝගවල 19 වන නියෝගයේ කර්තව්‍යයන් කරගෙන යන්නන් ලෙස දැනටමත් සඳහන් කරනු ලැබිය හැකි අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් නිසි ලෙස බලය දුන් නිලධරයන් විසින් නෞකාවක් ශ්‍රී ලංකාවේ වරාය පහසුකමක තිබෙන විට පාලනයකට යටත් කෙරේ. එම පාලනය, මෙම නියෝගවල 15 වන සහ 16 වන නියෝගවල විධිවිධාන යටතේ නිකුත් කළ වලංගු ජාත්‍යන්තර නෞකා ආරක්ෂක සහතිකයක් හෝ වලංගු තාවකාලික අන්තර්ජාතික නෞකා ආරක්ෂක සහතිකයක් නෞකාව තුළ තිබෙන බව තහවුරු කිරීමට පමණක් සීමා විය යුතු ය. මෙම නියෝගවල හෝ ISPS සංග්‍රහයේ අ කොටසේ නියමයන් සමග නෞකාව අනුකූල නොවන බවට විශ්වාස කිරීමට පැහැදිලි සාධක ඇත්නම් මිස ඒවා වලංගු නම් පිළිගනු ලැබිය යුතු ය.

(2) පාලන සහ අනුකූලතා වැඩපිළිවෙල සම්මුතියෙන් XI-2 පරිච්ඡේදයේ 9 වන නියෝගයේ විධිවිධාන සමග අනුකූල විය යුතු ය.

(3) ශ්‍රී ලංකාවේ වරාය පහසුකමකට ඇතුළුවීමට අරමුණු කරන සෑම නෞකාවක් ම, ශ්‍රී ලංකා රජය විසින් නිසිලෙස බලය දෙන ලද නිලධරයන්ගේ ඉල්ලීම මත සම්මුතියේ XI-2 පරිච්ඡේදයේ 9 වන නියෝගයේ විස්තර කර ඇති ආරක්ෂක තොරතුරු සැපයිය යුතු ය. එවැනි තොරතුරු සැපයීම නෞකාධිපතිවරයා විසින් ප්‍රතික්ෂේප කළ හැකි වුව ද එසේ කිරීම ප්‍රතික්ෂේප කිරීම වරායට ඇතුළු වීම ප්‍රතික්ෂේප කිරීමට හේතු විය හැකි බවට අවබෝධ කරගත යුතු ය.

25. අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින්, වෙනත් ආරක්ෂක ක්‍රියාමාර්ග අවම වශයෙන් මෙම නියෝගවල හෝ ISPS සංග්‍රහයේ අ කොටසේ නියම කර ඇති ක්‍රියාමාර්ගවලට සමාන එවැනි වෙනත් ආරක්ෂක ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමට ශ්‍රී ලංකා ධජය යටතේ යාත්‍රා කිරීමට හිමිකම්ලත් විශේෂිත නෞකාවකට හෝ නෞකා සමූහයකට අවසර දෙනු ලැබිය හැකි ය. එවැනි ආරක්ෂක වැඩපිළිවෙලකට අවසර දෙන අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් ඒ පිළිබඳ තොරතුරු සංවිධානයට දැනුම් දිය යුතු ය.

## III වන කොටස

### *වරාය පහසුකම් ආරක්ෂාව*

26. (1) මේ කොටසේ කාර්යයන් සඳහා සහ සම්මුතියේ XI-2 පරිච්ඡේදයට සහ ISPS සංග්‍රහයට අනුකූලව ශ්‍රී ලංකා අධිකරණ කලාපය තුළ වරාය පහසුකම් ආරක්ෂාව සහ නෞකා හා වරාය අන්තර් ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් නාවික හමුදාපතිවරයා නම් කළ බලධරයා විය යුතු ය. මේ කොටසේ විධිවිධාන බලාත්මක කිරීම නම් කළ බලධරයා සතු වේ.

(2) සම්මුතියේ XI-2 පරිච්ඡේදයට සහ ISPS සංග්‍රහයේ අ කොටසට අනුව පත්කළ බලධරයාට -

(අ) වරාය පහසුකම් සඳහා අදාළ ආරක්ෂක මට්ටම සකස් කිරීම සඳහා;

(ආ) වරාය පහසුකම් ආරක්ෂක සැලසුමක් සකස් කිරීම සඳහා වගකිව යුතු වරාය පහසුකම් ආරක්ෂක නිලධරයකු පත් කිරීමට අවශ්‍ය රට තුළ පිහිටා ඇති පහසුකම් කවරේද යන්න තීරණය කිරීම සඳහා;

(ඇ) වරාය පහසුකම් ආරක්ෂක ඇගයීමේ සහ කලින් අනුමත ඇගයීමක යම් සමගාමී සංශෝධන අනුමත කිරීම සඳහා;

(ඈ) වරාය පහසුකම් ආරක්ෂක සැලසුම සහ කලින් අනුමත සැලසුමක යම් සමගාමී සංශෝධන අනුමත කිරීම සඳහා; සහ

(ඉ) අනුමත සැලසුම් පරීක්ෂා කිරීම සඳහා;

වගකීම ඇත.

(3) පත් කළ බලධරයා විසින් ආරක්ෂක මට්ටම් සකස් කළ යුතු අතර ශ්‍රී ලංකාවේ වරාය පහසුකමට සහ වරායකට ඇතුළුවීමට පෙරාතුව හෝ ශ්‍රී ලංකාවේ වරාය තුළ සිටින අතරතුර නෞකාවලට ආරක්ෂක මට්ටමේ තොරතුරු සැපයීම සහතික කළ යුතු ය. පවතින ආරක්ෂක මට්ටමේ, වෙනස්වීම් ඇති වන විට අවස්ථානුකූලව ආරක්ෂක මට්ටම පිළිබඳ තොරතුරු යථාවත් කරනු ලැබිය යුතු ය.

(4) (3) වන අනු නියෝගයට අනුව පහත දැක්වෙන සාධක, නියමිත ආරක්ෂක මට්ටම සකස් කිරීමේ දී සලකා බැලිය යුතු ය.

(අ) තර්ජනාත්මක තොරතුරුවල විශ්වාසනීයභාවයේ තත්ත්වය;

(ආ) තර්ජනාත්මක තොරතුරු තහවුරු වන මට්ටම;

(ඇ) තර්ජනාත්මක තොරතුරුවල නියත හෝ ආසන්නභාවයේ තරම; සහ

(ඈ) එවැනි ආරක්ෂක සිද්ධියක දී ඇතිවිය හැකි ප්‍රතිඵල.

27. (1) වරාය පහසුකම, ISPS සංග්‍රහයේ ආ කොටසේ දී ඇති මාර්ගෝපදේශ සැලකිල්ලට ගනිමින් සම්මුතියේ XI-2 පරිච්ඡේදයේ සහ ISPS සංග්‍රහයේ අ කොටසේ අදාළ නියමයන් සමඟ අනුකූල විය යුතු ය.

(2) ශ්‍රී ලංකාවේ වරාය පහසුකම් සම්බන්ධයෙන් පත්කළ බලධරයා විසින්,

(අ) වරාය පහසුකම් ආරක්ෂක ඇගයීම්, ISPS සංග්‍රහයේ අ කොටසේ විධිවිධානවලට අනුකූලව, විශ්ලේෂණය සහ අනුමතිය සිදු කරගෙන යන බවට; සහ

(ආ) ISPS සංග්‍රහයේ අ කොටසේ විධිවිධානවලට අනුව වරාය පහසුකම් ආරක්ෂක සැලසුම් වැඩි දියුණු කර විශ්ලේෂණය කර අනුමත කර සහ ක්‍රියාත්මක කර ඇති බවට සහතික කළ යුතු ය.

(3) ආරක්ෂාව පිළිබඳව ප්‍රකාශයක් ඉදිරිපත් කරන අවස්ථාව ඇතුළුව විවිධ ආරක්ෂක මට්ටම් සඳහා නිසි බලධරයකු විසින් වරාය පහසුකම් ආරක්ෂක සැලසුමක් ඉදිරිපත් කිරීමට අවශ්‍ය වැඩපිළිවෙලවල් නම් කර දැනුම් දිය යුතු ය.

(4) වරාය පහසුකම් එය පිහිටා ඇති රටේ පත්කළ බලධරයා විසින් සකස් කල ආරක්ෂක තත්වයන් මත කටයුතු කිරීම අවශ්‍ය වේ. ආරක්ෂක වැඩපිළිවෙලවල් සහ ක්‍රියාමාර්ග මගීන්ට, නෞකාවලට, නෞකාවල පිරිස්වලට සහ අමුත්තන්ට භාණ්ඩ සහ සේවාවලට වන බාධාවන් හෝ ප්‍රමාදයන් අවමයෙන් බලපාන පරිදි යම් ආකාරයකින් වරාය පහසුකම් තුළ දී අදාළ කරගනු ලැබිය යුතු ය.

28. (1) වරාය පහසුකම් ආරක්ෂක ඇගයීමක් පත්කළ බලධරයා විසින් සිදුකර ගෙන යා යුතු ය. පත්කළ බලධරයා විසින්, ශ්‍රී ලංකාව තුළ පිහිටා ඇති විශේෂ වරාය පහසුකමක වරාය පහසුකම ආරක්ෂක ඇගයීම කරගෙන යාමට පිළිගත් ආරක්ෂක සංවිධානයකට බලය පැවරිය හැකි ය.

(2) පිළිගත් ආරක්ෂක සංවිධානයක් විසින් වරාය පහසුකම් ආරක්ෂක ඇගයීමක් කරගෙන යනු ලැබ ඇති විට, ආරක්ෂක ඇගයීම, පත්කළ බලධරයා විසින් ISPS සංග්‍රහයේ අ කොටස සමඟ අනුකූලතාවය විශ්ලේෂණය කර අනුමත කළ යුතු ය.

(3) ඇගයීම කරගෙන යන තැනැත්තන්ට, මේ සංග්‍රහයේ ආ කොටසේ දී ඇති මාර්ගෝපදේශ සැලකිල්ලට ගනිමින්, ISPS සංග්‍රහයේ අ කොටසට අනුකූලව වරාය පහසුකමෙහි ආරක්ෂාව නිශ්චය කිරීමට නිසි දක්ෂතාවයක් තිබිය යුතු ය.

(4) වරාය පහසුකම් ආරක්ෂක ඇගයීම්, වරාය පහසුකම තුළ තර්ජනවල වෙනස්වීම හෝ සුළු වෙනස්වීම් සැලකිල්ලට ගනිමින් වාර අනුව විශ්ලේෂණය කර යථාවත් කළ යුතු අතර වරාය පහසුකමේ ප්‍රධාන වෙනස්වීම් සිදු වන විට කාලානුරූපව විශ්ලේෂණය කර යථාවත් කළ යුතු ය.

(5) වරාය පහසුකම් ආරක්ෂක ඇගයීමක පහත දැක්වෙන මූලිකාංගවත් අවම වශයෙන් ඇතුළත් විය යුතු ය -

(අ) ආරක්ෂා කිරීමට වැදගත් වන වත්කම් සහ පොදු කාර්ය ව්‍යුහයේ වටිනාකම හඳුනාගැනීම සහ විනිශ්චය කිරීම;

(ආ) ආරක්ෂක පියවරයන් පිහිටුවා ප්‍රමුඛතාවය ලබාදීම පිණිස වත්කම්වලට සහ යටිතල පහසුකම්වලට විය හැකි තර්ජන සහ ඒවා පැවතීමේ අවදානම හඳුනාගැනීම;

(ඇ) අවදානම අඩු කිරීම සඳහා ගත යුතු පියවර සහ පටිපාටිමය වෙනස් වීම් සහ ඒවායේ බලාත්මකභාවය හඳුනාගැනීම, තෝරාගැනීම සහ ප්‍රමුඛතාවය දීම;

(ඈ) යටිතල පහසුකම්, ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටිවල මානව සාධක ඇතුළු දුර්වලතා හඳුනාගැනීම.

(6) මෙම වරාය පහසුකම්වල ක්‍රියාකරු, පිහිටීම, මෙහෙයුම, මෙහෙයුම් උපකරණ සහ නිර්මාණය සමාන නම් පත්කළ බලධරයා විසින් වරාය පහසුකම් එකකට වඩා වැඩි ගණනක් ආවරණය කිරීමට වරාය පහසුකම් ආරක්ෂක ඇගයීමකට අවසර දෙනු ලැබිය හැකි ය.

(7) වරාය පරිශ්‍ර ආරක්ෂක ඇගයීමක් සම්පූර්ණ කළ පසුව ඇගයීම සිදු කරනු ලැබුවේ කෙසේ ද යන්න සම්පිණ්ඩනයක් ඇතුළත් කර වාර්තාවක් සකස් කළ යුතු ය. ඇගයීම තුළ දී සොයාගත් එක් එක් අවදානමේ විස්තරයක් සහ ගත යුතු පියවර පිළිබඳව විස්තරයක් එක් එක් පීඩාව ඉදිරිපත් කිරීමට භාවිත කරනු ලැබිය හැකි ය. අනවසර ප්‍රවේශ හෝ හෙළිදරව් වලින් වාර්තාව ආරක්ෂා කළ යුතු ය.

29. (1) නෞකා හෝ වරාය අන්තර් ක්‍රියාකාරිත්වය සඳහා ප්‍රමාණවත් එක් එක් වරාය පහසුකම් සඳහා වරාය පහසුකම් ආරක්ෂක ඇගයීමක් පදනම් කරගෙන වරාය පරිශ්‍ර ආරක්ෂක සැලසුමක් වැඩිදියුණු කර පවත්වාගෙන යනු ලැබිය යුතු ය. සංග්‍රහයේ අ කොටසේ නිර්වචනය කර ඇති පරිදි ආරක්ෂක මට්ටම් තුන සඳහා සැලසුම මගින් විධිවිධාන සැලැස්විය යුතු ය.

(2) (3) වන අනු නියෝගයේ විධිවිධානවලට යටත්ව පිළිගත් ආරක්ෂක සංවිධානයක් විසින් විශේෂිත වරාය පහසුකමක වරාය පරිශ්‍ර ආරක්ෂක සැලසුමක් සකස් කරනු ලැබිය හැකි ය.

(3) වරාය පහසුකම් ආරක්ෂක සැලසුමක් පත්කළ බලධරයා විසින් අනුමත කළ යුතු අතර එය ඉංග්‍රීසි භාෂාවෙන් විය යුතු ය.

(4) ISPS සංග්‍රහයේ ආ කොටසේ දෙන ලද මාර්ගෝපදේශ සැලකිල්ලට ගනිමින් ISPS සංග්‍රහයේ අ කොටසේ විධිවිධානවලට අනුකූලව එවැනි සැලසුමක් වැඩි දියුණු කළ යුතු ය.

(5) සැලසුමේ නිශ්චිතව සඳහන් කරන ලද ආරක්ෂක කටයුතුවල අභ්‍යන්තර විගණන සිදු කරන හෝ ඒවායේ ක්‍රියාත්මක කිරීම් ඇගයීම් කරන පිරිස්, වරාය පහසුකම් ප්‍රමාණය සහ ස්වභාවය අනුව ප්‍රායෝගික නොවන්නේ නම් මිස විගණන කටයුතුවල දී ස්වාධීනව කටයුතු කළ යුතු ය.

(6) වරාය පහසුකම් ආරක්ෂක සැලසුමක්, වරාය ආරක්ෂක සැලසුමක හෝ වෙනත් යම් වරාය හදිසි සැලසුමක හෝ සැලසුම් සමඟ ඒකාබද්ධ කළ හැකි ය. නැතහොත් ඒවායේ කොටසක් විය හැකි ය.

(7) පත්කළ බලධරයා විසින්, සැලසුමේ අදාළ සංශෝධන ඔවුන් විසින් අනුමත කර ඇත්නම් මිස වරාය පහසුකම් ආරක්ෂක සැලසුමක කවර වෙනස්වීම් ක්‍රියාත්මක නොකළ යුතු ද යන්න තීරණය කළ යුතු ය.

(8) සැලසුම ඉලෙක්ට්‍රොනික ආකෘතියකින් තැබිය හැකි ය. එවැනි කාරණාවක දී එහි අනවසර මකා දැමීම, විනාශ කිරීම් හෝ සංශෝධන කිරීම් වැළැක්වීම අරමුණු කළ ක්‍රියා පටිපාටියක් මගින් එය ආරක්ෂා කරනු ලැබිය යුතු ය.

(9) පත්කළ බලධරයා විසින්, මෙම වරාය පරිශ්‍රවල ක්‍රියාකරු, පිහිටීම, මෙහෙයුම්, උපකරණ සහ නිර්මාණය සමාන වේ නම්, වරාය පහසුකම් එකකට වඩා වැඩි ගණනක් ආවරණය කිරීමට වරාය පරිශ්‍ර ආරක්ෂක සැලසුමකට අවසර දිය හැකි ය. අධ්‍යක්ෂ-ජනරාල්වරයා මගින් පත්කළ බලධරයා විසින් අවසර දෙන එවැනි විකල්ප සැලැස්මක දී එහි තොරතුරු සංවිධානයට දැනුම් දිය යුතු ය.

30. නෞකා ආරක්ෂක ඇගයීම්වලට, නෞකා ආරක්ෂක සැලසුම්වලට සහ වරාය පහසුකම් ආරක්ෂක සැලසුම්වලට සහ තනි ඇගයීම්වලට හෝ සැලසුම්වලට අදාළ සංවේදී ආරක්ෂක උපකරණ පිළිබඳ අනවසර හෙළිදරව් කිරීම්වලින් හෝ ඒවාට ප්‍රවේශ වීම් වැළැක්වීමට නිසි වැඩපිළිවෙලවල් ස්ථානගත කර තිබේ ද යන්න පිළිබඳ පත්කළ බලධරයා විසින් සහතික විය යුතු ය.

31. (1) වරාය පරිශ්‍රයකට වරාය පහසුකම් ආරක්ෂක නිලධරයකු පත්කළ යුතු අතර එසේ පත්කළ තැනැත්තා විසින් වරාය පහසුකම් එකක් හෝ ඊට වැඩි ගණනක් සඳහා වරාය පරිශ්‍ර ආරක්ෂක නිලධරයකු ලෙස ක්‍රියා කළ හැකි ය.

(2) සංග්‍රහයේ අ කොටසේ වෙනත් තැනක නිශ්චිතව සඳහන් කර ඇති කරුණු වලට අමතරව වරාය පහසුකම් ආරක්ෂක නිලධරයකුගේ කාර්යයන් සහ වගකීම් ලෙස -

(අ) අදාළ වරාය පහසුකම් ආරක්ෂක ඇගයීම සැලකිල්ලට ගනිමින්, මූලික වරාය පහසුකම් පූර්ණ ආරක්ෂක සමීක්ෂණයක් පැවැත්වීම;

(ආ) වරාය පහසුකම් ආරක්ෂක සැලසුම වැඩිදියුණු කර පවත්වාගෙන යාම සහතික කිරීම;

(ඇ) වරාය පහසුකම් ආරක්ෂක සැලසුම ක්‍රියාත්මක කර පරීක්ෂා කිරීම;

(ඈ) සුදුසු ආරක්ෂක වැඩපිළිවෙලක අඛණ්ඩතාවය තහවුරු කිරීමට වරාය පහසුකමෙහි නිතිපතා ආරක්ෂක පරීක්ෂා කිරීම් භාරගැනීම;

(ඉ) ඌනතා නිවැරදි කිරීම සහ වරාය පහසුකමෙහි සිදුකළ අදාළ වෙනස්කම් සැලකිල්ලට ගැනීමට සැලසුම් යථාවත් කිරීම පිණිස සුදුසු පරිදි වරාය පහසුකම් ආරක්ෂක සැලසුම්වලට කරන වෙනස්කම් නිර්දේශ කිරීම සහ සංස්ථාගත කිරීම;

(ඊ) වරාය පහසුකමෙහි පිරිස්වල ආරක්ෂක දැනුම්වත්භාවය සහ සුපරීක්ෂකභාවය වැඩි කිරීම;

(උ) වරාය පහසුකමෙහි ආරක්ෂාව සඳහා වගකිව යුතු පිරිස්වලට (කාර්ය මණ්ඩලයට) සහ වරායේ වෙනත් සියලු පිරිස්වලට ප්‍රමාණවත් පුහුණුවක් සපයා ඇති බව සහතික වීම;

(ඌ) වරාය පහසුකමෙහි ආරක්ෂාව ඇති වන තර්ජනයක් අදාළ බලධරයන්ට වාර්තා කර දැනුම් දීමේ වාර්තා පවත්වාගෙන යාම;

(එ) සුදුසු සමාගම් සහ නෞකා ආරක්ෂක නිලධරයන් සමඟ වරාය පහසුකම් ආරක්ෂක සැලසුම් ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය කිරීම;

(ඒ) නෞකා භාවිතයේ දී හෝ ඔවුන්ගේ වරාය පහසුකම් භාවිතා කිරීමට අරමුණු කිරීමේ දී සමාගමේ ආරක්ෂක නිලධරයා සහ නෞකා ආරක්ෂක නිලධරයා සමඟ ආරක්ෂාව පිළිබඳ කාරණා සම්බන්ධව ඵලදායි සන්නිවේදන පවත්වාගෙන යාම;

(ඔ) සුදුසු පරිදි ආරක්ෂක සේවා සමග සම්බන්ධීකරණය කිරීම;

(ඕ) වරාය පහසුකම සඳහා වග කියන පිරිස් සම්මතයන් සපුරා ඇති බව සහතික කිරීම;

(ක) අවශ්‍ය විට දී, ආරක්ෂක උපකරණ නිසි ආකාරයෙන් ක්‍රියාත්මක වන බව, පරීක්ෂා කළ බව, ක්‍රමාංකනය කළ බව නඩත්තු කළ බව සහතික කිරීම; සහ

(ග) සුවිශේෂී තත්ත්වයන් වල දී, නෞකාවට ඇතුළුවීමට බලාපොරොත්තු වන්නන්ගේ අනන්‍යතාවය තහවුරු කිරීමේ දී, ආරක්ෂක නිලධරයන්ට උදවු කරන ලෙස ඉල්ලා සිටි විට සහාය ලබා දීම.

යන කාර්යයන් ඇතුළත් විය යුතු නමුත් එයට සීමා නොවිය යුතු ය.

32. (1) වරාය පහසුකම් ආරක්ෂක නිලධරයකු, සංවිධානය විසින් වැඩිදියුණු කළ මාර්ගෝපදේශ සැළකිල්ලට ගනිමින් ISPS සංග්‍රහයේ අ කොටසේ නිශ්චිතව දක්වා ඇති පරිදි ආරක්ෂක පුහුණුව අදාළ IMO ආදර්ශ පාඨමාලාව සහ අනුබද්ධ පුහුණු සහතිකය සම්පූර්ණ කර තිබිය යුතු ය.

(2) විශේෂ ආරක්ෂක කාර්යයන් දරන වරාය පහසුකමෙහි සේවක පිරිස්, වරාය පරිශ්‍ර ආරක්ෂක සැලසුමේ විස්තර කර ඇති පරිදි වරාය පහසුකම් ආරක්ෂාව සඳහා ඔවුන්ගේ කාර්යයන් සහ වගකීම් තේරුම්ගත යුතු අතර මේ සංග්‍රහයේ ආ කොටසේ දෙන ලද මාර්ගෝපදේශ සැලකිල්ලට ගනිමින් පවරන ලද ඔවුන්ගේ කාර්යයන් ඉටු කිරීමට ප්‍රමාණවත් දැනුමක් තිබිය යුතු ය.

(3) වරාය පහසුකම් ආරක්ෂක සැලසුමක ඵලදායී ක්‍රියාකාරීත්වය සහතික කිරීමට, වරාය පහසුකම විසින් වරාය පහසුකමෙහි මෙහෙයුම්වල ස්වභාවය, වරාය පහසුකමෙහි සේවක පිරිස්වල වෙනස්වීම්, වරාය පහසුකම සේවය සලසන නෞකාවල ස්වභාවය සහ වෙනත් අදාළ කරුණු සැලකිල්ලට ගනිමින් මෙම සංග්‍රහයේ ආ කොටසේ දෙන ලද මාර්ගෝපදේශ සැලකිල්ලට ගනිමින් සුදුසු කාල විරාමයන්වල දී පුහුණුවීම් කරගෙන යා යුතු ය.

(4) වරාය පහසුකම් ආරක්ෂක නිලධරයකු විසින් සංවිධානය විසින් වැඩිදියුණු කල මාර්ගෝපදේශ සැලකිල්ලට ගනිමින් සුදුසු කාල විරාමයන්වල දී ක්‍රියාකාරකම්වලට සහභාගී වෙමින් වරාය පහසුකම් ආරක්ෂක සැලසුමක ඵලදායි සම්බන්ධීකරණය සහ ක්‍රියාත්මකභාවය සහතික කළ යුතු ය.

33. (1) පත්කළ බලධරයා විසින්-

(අ) ශ්‍රී ලංකාව තුළ යම් වරාය පහසුකමක් පරීක්ෂා කිරීම; සහ

(ආ) මෙම නියෝගවලට සහ ISPS සංග්‍රහයට වරාය පහසුකම අනුකූල වන්නේ නම්, ඒ වරාය පහසුකම අනුකූල වන්නේ නම්, ඒ වරාය පහසුකම සම්බන්ධයෙන් අනුකූලතා ප්‍රකාශයක් එය නිකුත් කරන දින සිට වසර පහකට නොවැඩි කාල සීමාවක් සඳහා නිකුත් කිරීම

කළ යුතු ය.

(2) (1) වන අනු නියෝගයේ සඳහන් කරන ලද අනුකූලතා ප්‍රකාශයක්, පත්කළ බලධරයා විසින් නිකුත් කළ වාර්ෂික තහවුරු කිරීමේ ඇගයීම්වලට යටත් විය යුතු ය.

(3) වාර්ෂික තහවුරු කිරීමේ ක්‍රියාකාරකමක දී වරාය පහසුකම්වලට අදාළ වන ISPS නියමයන් හෝ පත්කළ බලධරයා විසින් පනවන ලද යම් අතිරේක නියමයන්ට වරාය පහසුකම් අනුකූල නොවන බවට එය තීරණය කරන අවස්ථාවක දී අඩුපාඩු හෝ අනනුකූලතාව නිවැරදි කරන හෝ අනුකූලතා ප්‍රකාශය ඉල්ලා අස්කර ගන්නා තෙක් පත්කළ බලධරයා විසින් අනුකූලතා ප්‍රකාශය අත්හිටවනු ලැබ හැකි ය.

(4) වරාය පහසුකම් අනුකූලතා ප්‍රකාශය ISPS සංග්‍රහයේ ඇමුණුමේ දක්වා ඇති ආකෘතියෙන් ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කළ යුතු අතර මුල් අනුකූලතා ප්‍රකාශය වරාය පහසුකමෙහි ලබා ගැනීමට තැබිය යුතු ය.

## IV වන කොටස

### *සාමාන්‍ය විධිවිධාන*

34. සම්මුතියේ XI-I පරිච්ඡේදයේ පාදක සටහන් සහ පාදක සටහන් මගින් යොමු කළ යෝජනාවලියේ චක්‍රලේඛන හෝ ලේඛන මෙම නියෝගවල කොටසක් ලෙසට ලැබිය යුතු ය.

35. අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින්, මෙම නියෝගවල විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය විය හැකි පරිදි, සම්මුතියේ හෝ 1988 ප්‍රොටකෝලයේ විධිවිධානවල අවම තාක්ෂණික ප්‍රමිතීන් හා අනුකූල වීම සපුරාලන යම් ප්‍රමිතීන් නිකුත් කළ හැකි ය.

36. මේ නියෝගවල-

"තොග වාහකයා" යන්නෙන් සම්මුතියේ IX පරිච්ඡේදයේ 1.6 නියෝගයේ නිශ්චය කර ඇති පරිදි තොග ගෙන යන්නකු අදහස් වේ;

"රසායනික ද්‍රව්‍ය නෞකාව" යන්නෙන්, සම්මුතියේ VII පරිච්ඡේදයේ 8.2 නියෝගයේ නිශ්චය කර ඇති පරිදි රසායනික ද්‍රව්‍ය ගෙන යන නෞකාවක් අදහස් වේ;

"වාහකයා" යන්නෙන්, සම්මුතියේ VII පරිච්ඡේදයේ 11.2 නියෝගයේ නිශ්චිතව දක්වා ඇති පරිදි වායු ප්‍රවාහකයකු අදහස් වේ;

"අධිවේගී යාත්‍රා" යන්නෙන්, සම්මුතියේ X පරිච්ඡේදයේ 1.2 නියෝගයේ නිශ්චිතව දක්වා ඇති පරිදි යාත්‍රාවක් අදහස් වේ;

"ජංගම අක්වෙරළ විදුම් ඒකකය" යන්නෙන්, සම්මුතියේ IX පරිච්ඡේදයේ 1 වන නියෝගයේ නිශ්චිතව දක්වා ඇති පරිදි ස්ථානයක නොව යාන්ත්‍රිකව ධාවනය වන ජංගම අක්වෙරළ ඒකකයක් අදහස් වේ;

"තෙල් නෞකාව" යන්නෙන්, සම්මුතියේ II-1 පරිච්ඡේදයේ 2.22 නියෝගවල නිශ්චිතව දක්වා ඇති පරිදි තෙල් නෞකාවක් අදහස් වේ;

"සමාගම" යන්නෙන්, නෞකාවේ අයිතිකරු හෝ අයිතිකරුගෙන් නෞකාව මෙහෙයවීමේ වගකීම පවරාගනු ලැබුවා වූ ද, එසේ වගකීම පවරාගැනීමෙන් පසුව ජාත්‍යන්තර ආරක්ෂක කළමනාකරණ සංග්‍රහය මගින් සමාගම වෙත නියම කරනු ලැබ ඇති සියලු කාර්යය සහ වගකීම් භාරගැනීමට එකඟ වී ඇත්තා වූ ද, කළමනාකරුවකු හෝ ආවරණ රහිත බෝට්ටු "චාටර් ක්‍රමයට" කුලියට දෙන තැනැත්තකු හෝ එවැනි වෙනත් සංවිධානයක් නැතහොත් තැනැත්තෙක් අදහස් වේ;

"නෞකා හෝ වරාය අන්තර් ක්‍රියා" යන්නෙන්, නෞකාවට හෝ නෞකාවෙන් පුද්ගල යන්නෙන් භාණ්ඩවල හෝ වරාය සේවා සැපයීමේ සංචලනයන්ට සම්බන්ධ ක්‍රියා මාර්ගවලින් නෞකාවක් කෙලින්ම හෝ ක්ෂණිකව බලපෑමට ලක්වන අවස්ථාවක පවතින අන්තර් සම්බන්ධතාවය අදහස් වේ;

"වරාය පරිශ්‍ර" යන්නට, නෞකා සහ වරාය අන්තර් සම්බන්ධතාවය සිදු වන්නේ කවර ස්ථානයක ද ශ්‍රී ලංකා රජය විසින් හෝ පත්කළ බලධරයා විසින් තීරණය කරන පරිදි වූ එවැනි ස්ථානයක් අදහස් වේ. මෙහි නැංගුරම්ලන ප්‍රදේශ නිදන මැදිරි සහ මුහුදෙන් වූ පිවිසුම් මාර්ග ලෙස වූ යම් ප්‍රදේශ සුදුසු පරිදි ඇතුළත් වේ;

"වරාය පරිශ්‍ර ආරක්ෂක නිලධරයා" යන්නෙන්, වරාය පහසුකම් ආරක්ෂක සැලසුම වැඩිදියුණු කිරීම, ක්‍රියාත්මක කිරීම, සංස්කරණය කිරීම සහ පවත්වාගෙන යාම සඳහා සහ නෞකා ආරක්ෂක නිලධරයන් සහ සමාගම් ආරක්ෂක නිලධරයන් සමග සම්බන්ධීකරණය පවත්වාගෙන යාම සඳහා වගකිව යුතු ලෙසට පත්කළ තැනැත්තන් අදහස් වේ;

"නෞකාවකින් නෞකාවකට සිදුකරන ක්‍රියාකාරකම්" යන්නෙන්, එක නෞකාවකින් වෙනත් නෞකාවකට භාණ්ඩ හෝ තැනැත්තන් මාරු කිරීමට සම්බන්ධ වන, වරාය පහසුකමට අදාළ නොවන යම් කටයුත්තක් අදහස් වේ.

"නම් කළ බලධරයා" යන්නෙන්, වරාය පහසුකම් ආරක්ෂාවට සහ වරාය පහසුකමකට අරමුණින් වූ නෞකා සහ වරාය අන්තර් සම්බන්ධතාවය අදාළ වන මේ පරිච්ඡේදයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා වගකිව යුතු ශ්‍රී ලංකාව තුළ හඳුනාගත් තැනැත්තකු අදහස් වේ;

"ජාත්‍යන්තර නෞකා හා වරාය පහසුකම් ආරක්ෂක (ISPS) සංග්‍රහය" යන්නෙන්, සංවිධානය විසින් සංශෝධනය කළ හැකි පරිදි 1974 මුහුදේ දී ජීවිත ආරක්ෂාව සඳහා වූ ජාත්‍යන්තර සම්මුතියේ ගිවිසුම්කාර රාජ්‍යයන්ගේ සමුළුවේ දෙවන යෝජනා සම්මතය මගින් 2002 දෙසැම්බර් මස 12 වන දින දී සම්මත කරගත් පරිදි අ කොටසේ (නියෝග ලෙස සළකනු ලැබිය යුතු විධිවිධාන) සහ අ කොටසේ (නිර්දේශ ලෙස සැළකිය යුතු විධිවිධාන) ඇතුළත් ජාත්‍යන්තර නෞකා සහ වරාය පහසුකම් ආරක්ෂක සංග්‍රහය අදහස් වේ;

"ආරක්ෂක සිද්ධි" යන්නෙන්, ජංගම අක්වෙරළ විහිදුම් එකක සහ අධිවේගී යාත්‍රා හෝ වරාය පහසුකමක් හෝ යම් නෞකාවක හෝ වරායක අන්තර් සම්බන්ධතාවයක් හෝ නෞකාවකින් නෞකාවකට සිදුවන යම් ක්‍රියාවක් ඇතුළුව නෞකාවක ආරක්ෂාවට තර්ජනයක් වන යම් සැක සහිත ක්‍රියාවක් හෝ සිද්ධියක් අදහස් වේ;

"ආරක්ෂක මට්ටම" යන්නෙන්, උත්සාහ දරමින් සිටින හෝ සිදුවෙන ආරක්ෂක ගැටුමක අවදානම් තත්ත්වයේ යෝග්‍යතාවය අදහස් වේ;

"ආරක්ෂක ප්‍රකාශය" යන්නෙන්, නෞකාවක සහ එය අන්තර් සම්බන්ධ වන වරාය පරිශ්‍රයක් හෝ වෙනත් නෞකාවක් යන දෙකෙන් එකක් අතර එක් එක් අය විසින් ක්‍රියාත්මක කරන ආරක්ෂක පියවර නිශ්චය කරමින් ඇති කරගන්නා ගිවිසුමක් අදහස් වේ;

"පිළිගත් ආරක්ෂක සංවිධාන" යන්නෙන්, ආරක්ෂක කාරණා පිළිබඳ නිසි නිපුණතාවයක් සහ මෙම පරිච්ඡේදයෙන් හෝ ISPS සංග්‍රහයේ අ කොටසින් නියම කළ ඇගයීමක්, හෝ තහවුරු කිරීමක් හෝ අනුමතියක් හෝ සහතික කිරීමේ කාර්යයක් කරගෙන යාමට බලය දෙන ලද නෞකාවක් සහ වරාය මෙහෙයුම් පිළිබඳ නිසි දැනුමක් ඇති සංවිධානයක් අදහස් වේ; සහ

"සංවිධාන" යන්නෙන්, ජාත්‍යන්තර සමුද්‍රීය සංවිධානය අදහස් වේ.

EOG 02 - 0240

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.